**උපදේශකත්වය**
**නිල් බණ්ඩාර හපුහින්න**
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම**
**ලාල් සමරසේකර**
අධ්‍යක්ෂ
**ඩී.එම්.එස්.ආර්.ටී. දිසානායක**
සහකාර අධ්‍යක්ෂ
රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා
වෘත්තීය මාර්ගෝපදේශ අංශය
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව

**සංස්කරණය**
**චිරන්දතී රන්දෙනිය**
වෘත්තීය මාර්ගෝපදේශ නිළධාරි

**සහය**
**අරුණ විජේසේකර**
මානව සම්පත් සංවර්ධන නිලධාරී

**පිට කවර නිර්මාණය**
රුසිරු තරංග
සචිත් දිල්ෂාන්

**පසු පිට චිත්‍ර නිර්මාණය**
සිබිල් වෙත්තසිංහ

**ප්‍රකාශනය**
රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා
වෘත්තීය මාර්ගෝපදේශ අංශය
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව
කම්කරු හා වෘත්තීය සමිති
සබඳතා අමාත්‍යාංශය

**මුද්‍රණය**
ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට්
(පුද්ගලික) සමාගම
නො. 52/1, එක්වත්ත පාර,
මිරිහාන, නුගේගොඩ.
0112 815 816

ISSN 1391-622x

# පෙළ ගැස්ම

1



2




3



4



5



6



7



8



9



10



11


## සංස්කාරක සටහන



# පාසලයි වැඩ ලොවයි...

අධ්‍යාපනයේ මූලික පරමාර්ථය රැකියාව නොවුනත් අධ්‍යාපනය හමාර කරන හැම දරුවෙක්ම තම අනාගත ජීවන වෘත්තිය කෙරේ යොමුවීම සාමාන්‍ය දෙයකි. මේ නිසාම රැකියාවක් කිරීමේ වැදගත්කම, රැකියාවක් කිරීමේ අවශ්‍යතාවය, රැකියාවක් සඳහා අවශ්‍යවන කුසලතා පිළිබඳ යම් හැඟීමක්, දැනීමක්, වැටහීමක් සෑම දරුවෙක් තුළම පාසල් වියේ සිට ගොඩ නැඟී තිබිය යුතුය. මන්ද ඒ තුළින් දරුවා අනාගත වැඩ ලොවට ප්‍රවේශ වීමේදි අවශ්‍ය වන පෞරුෂ ගුණාංග, ධනාත්මක ආකල්ප, වෘත්තීය කුසලතා පාසල් වියේ සිටම ඔහු තුළ සංවර්ධනය කර ගත හැකි බැවිනි. විශේෂයෙන්ම අනාගත වැඩලෝකය තුළ වැඩි වටිනාකමක් ලැබෙන නිර්මාණශිලි බව, අර්බුද කළමනාකරණය සහකම්පනය, අවංකකම, ආචාරධර්ම හා නීතිරීතිවලට ගරු කිරීම,කණ්ඩායමක් සමඟ වැඩකිරීම වැනි ගුණාංග යන් පුද්ගලයෙකුට එක් දිනකින් හෝ මාසයකින් ගොඩනගා ගත හැකි තත්ත්වයක් නොවේ. එය පුද්ගලයාගේ ජීවිතයට බද්ධව පැවතිය යුතු දෙයකි. එසේම එම තත්ත්වයන් විද්‍යාත්මකව හඳුනාගත හැකි පිරිස් කළමණාකරුවන් ඉතා ප්‍රවේශමෙන් තම ආයතනය සඳහා සුදුසු සේවකයන් තෝරා ගනී. එහිදී අවස්ථාව ලැබෙනුයේ අතිවිශිෂ්ඨයන්ටමය. මේ නිසාම දරුවාගේ ජීවිතයේ කොටසක් ලෙස, පාසල් වියේදීම ඔහුගේ ගතට හා සිතට මෙවැනි ගුණාංගයන් ඇතුල් කළ යුතුයි. මෙහිදී කුඩා කල සිටම දරුවන්ගේ සහජ දක්ෂතාවයන් හඳුනා ගෙන නිවැරදි දිශාවට දරුවා යොමු කිරීම ද, ක්‍රමානුකූලව වැඩ අත්දැකීම් අත් විඳින්නට දරුවාට ඉඩ ලබා දීම ද වැදගත්ය. ලෝකයේ බොහෝ රටවල්වල එවැනි අවස්ථාවන් පාසල් වියේදීම දරුවන්ට ලැබුණත් අප රටේ දරුවන් තවමත් පොත් පිටු අතර පමණක් සැරිසැරීම කණගාටුදායක කරුණකි. පාසල් විෂයන් සඳහා මෙන්ම බාහිර ක්‍රියාකාරකම් කෙරේද දරුවා යොමු කිරීම අධ්‍යාපනයට බාධාවක් ලෙස වැඩිහිටියන් නොසිතිය යුතුය. ඔවුන්ට මඟ පෙන්විය යුත්තේ එම කටයුතු සමබරව පවත්වා ගන්නා ආකාරය පිළිබඳවයි.

මෙවර "හසර" කලාපයේ අරමුණ වන්නේ අනාගත වැඩ ලොව සඳහා කුසලතාවයෙන් හා මනා පෞරුෂයෙන් පිරි දරුවන් බිහි කිරීමට පාසලින් කෙරෙන මඟ පෙන්වීමේ හා වැදගත්කම පිළිබඳ තවදුරටත් ඔබ දැනුවත් කිරීමයි. ඒ තුළින් පාසල් විෂයන් හා ක්‍රියාකාරකම් පිළිබඳ ධනාත්මක අයුරින් විමසා බලා ඉන් නිසි ප්‍රයෝජන ගැනීමට ඔබට හැකි වේවායි යනු "හසර" අපේ පැතුමයි.

එරන්දතී රන්දෙනිය





# තරුණ විරැකියාව ජයගන්නට නම්



**නීල් බණ්ඩාර හපුහින්න**
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

**තරුණ විරැකියාව වර්තමානයේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන බරපතල ගැටළුවකි. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූලාශ්‍රයන් හා ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව 2018 අවසන් කාර්තුවේ ශ්‍රී ලංකාවේ විරැකියා ප්‍රතිශතය 4.6 කි. මින් අදහස් වන්නේ ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනය රැකියා වියුක්තව හෝ ඌන සේවා නියුක්තව සිටීම නිසාම ඔවුන්ට සමස්ත ආර්ථිකයට දායකවීමට නොහැකි වී ඇති බවකි. එසේම ඔවුන් විරැකියාවෙන් පසුවීම නිසා අපේක්ෂා භංගත්වයට හා අසහනයට පත්වීම මෙන්ම තරුණ ශ්‍රමය රටට අහිමිවීමත්, ඒ නිසාම බරපතල සමාජ ආර්ථික ගැටලු රාශියක් ඇතිවීමත් සිදු වී ඇත.**

**මෙවැනි තත්ත්වයක් ඇතිවීමට බලපා ඇති හේතු කාරණා රැසකි.**

**01. ශ්‍රම වෙළෙඳපොළ තුළ නිසි ආර්ථික ප්‍රතිපත්තියක් නොමැති වීම.**

ලෝකයේ සෑම රටක්ම පාහේ ශ්‍රම වෙළෙඳ පොළ කෙසේ සකස් විය යුතුද යන්න පිළිබඳ මනා වටහා ගැනීමකින් කටයුතු කරයි. එනම් තම රටට කළ හැක්කේ කුමක්ද? රටට ගැලපෙන නිෂ්පාදන, ව්‍යාපාර, මුදල් උපයන මාර්ග කවරේද? රටේ පවතින සම්පත් මොනවාද යන්න පිළිබඳ විමසා බලා තම ආර්ථික හා අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම සිදු කරයි. ඒ අනුව තරුණ ශ්‍රමය එම දිශාවට යොමු කරමින් රට සංවර්ධනය කරයි. නමුත් ශ්‍රී ලංකාව එසේ නොවේ. අප රටට වඩාත් ගැලපෙන කර්මාන්ත වූ සංචාරක කර්මාන්තය, වරාය, ගුවන්, අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර හඳුනා ගෙන එවැනි ක්ෂේත්‍රවලට තරුණ තරුණියන් යොමු නොකර නුපුහුණු ශ්‍රමිකයන් විදේශගත කිරීම වැනි මාර්ගවලින් මුදල් උපයා ගැනීමට පෙළෙඹී සිටී. මේ නිසාම රට තුළ ප්‍රශ්න රාශියක් නිර්මාණය වී ඇති අතර පවුල් විසිරයාම, මත් ද්‍රව්‍ය භාවිතය වැනි තත්ත්වයන් පවා රටතුළ ව්‍යාප්ත වී ඇත. එහෙත් අපට ගැලපෙන ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ අනුව අපේ ආර්ථික, අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ප්‍රතිපත්ති සකස් කෙරෙන්නේ නම් එම ක්ෂේත්‍රවලින් පුහුණුවීම් ලබන තරුණ තරුණියන්ට රැකියාවක් හා වටිනාකමක් ලැබේ.

**02. සෘණාත්මක ආකල්ප හා හැකියාවට මුල් තැන නොදීම.**

අප රටේ බොහෝ තරුණ තරුණියන් නිතරම රැකියාවන් සොයන්නේ තම ලැදියාව මුල් කොට ගෙන වන අතර තම වෘත්තිය ශක්‍යතාවය හෝ තමාගේ විභවතාවය පිළිබඳ නිසි වැටහීමක් ඔවුනට නොමැත. එසේම උපාධිධාරීන් පවා රජයේ සම්ප්‍රදායික රැකියාවලටම යොමුවීමට අපේක්ෂා කරන අතර නිර්මාණශීලී ලෙස ශ්‍රම වෙළෙඳපොළ ජය ගැනීමට උත්සාහ නොකරයි. මේ නිසාම රටට අවශ්‍ය ව්‍යවසායකයන්, නව නිෂ්පාදකයින්, නිර්මාණශීලී තරුණ තරුණියන් බිහිකිරීම සඳහා වෘත්තිය පුහුණු ආයතන,

අධ්‍යාපන ආයතන, ශ්‍රම වෙළෙඳ පොළ සමග අත්වැල් බැඳ ගත යුතුව ඇත.

### 03. දෙමාපියන් හා දරුවන්ගේ රැකියා බලාපොරොත්තු පරස්පර වීම.

ළමයාගේ කැමත්ත, දක්ෂතාවය පවතින ක්ෂේත්‍ර පිළිබඳ නිසි වැටහීමක්, හැඟීමක් නොමැති දෙමාපියන් තමන් වෙතින් ගිලිහී ගිය වෘත්තිය අපේක්ෂාවන් තම දරුවාගෙන් සඵල කර ගැනීමට සිතීම වරදකි. මේ නිසාම දරුවන් තමාට නොගැලපෙන ක්ෂේත්‍රවලින් අධ්‍යාපනය ලබා අසාර්ථක වීම සුලබ සිදුවීමකි. මේ සඳහා පළපුරුදු වෘත්තීය මාර්ගෝපදේශකයින්ගේ නිසි මග පෙන්වීම් ලබා ගනිමින් දරුවන් නිසි මගට යොමු කරන්නේ නම් ඔවුන් මතු දිනයේ විරැකියාවෙන් පීඩා නොවිඳිනු ඇත.

### 04. රට තුළ පවත්නා පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟය

අද ශ්‍රී ලංකාව තුළ සිදුවන දැවැන්ත ඉදිකිරීම් සඳහා ඉන්දියාව, චීනය වැනි රටවලින් ශ්‍රමිකයින් ලබා ගැනීමට සිදුවී ඇති බව නොරහසකි. එක් පසෙකින් විරැකියාවෙන් පෙළෙන ජනතාවක් සිටියදී මෙවැනි තත්ත්වයන් රට තුළ නිර්මාණය වීමට විවිධ වූ හේතු ඇත. මෙම අභිමිවන රැකියා අවස්ථා හිමි කර ගනිමින් ඉහළ වරප්‍රසාද භුක්ති විඳීමට නම් අප රටේ තරුණ පරපුර ඔවුන්ගෙන් ඉගෙන ගත යුතු පාඩම් බොහෝ ඇත. විශේෂයෙන් කලට වැඩ ඇරඹීම, අවසන් කිරීම, විනය ඉවසීම, වැඩෙහි අති දක්ෂතාවය, ලැබෙන පළමු අවස්ථාවෙන් රැකියාව ආරම්භ කිරීම අපේ තරුණ තරුණියන් ද ඉගෙන ගත යුතු පාඩම් ය.

### 05. රැකියාවක් කිරීමේ වැදගත්කම පිළිබඳව ඇති හැඟීම

ඕනෑම අයෙකුට රැකියාවක් කිරීමේ වැදගත්කම හිත ගත දෙකටම දැනිය යුතු තත්ත්වයකි. තම පැවැත්ම ඇත්තේ රැකියාව තුළය. මේ නිසාම තේරෙන අවධියේ සිටම, එනම් පාසල් වියේ සිටම වැඩ ලෝකය පිළිබඳව රැකියා අවස්ථා සුදුසුකම්, තමාට කළ හැකි දේ, තම රුචිකම් පිළිබඳ අවබෝධයක් දරුවාට තිබිය යුතුය. එය පාසලෙන්ද ලැබිය යුතුය. වෙනත් රටවල පාසල් වියේ සිටම, එනම් නිවාඩු කාලයේ පවා දරුවන් වැඩ ලොවට ගොස් යමක් උපයා ගැනීම, ඉන් අධ්‍යාපනය ලැබීම තම ජීවන පුරුද්දක් කර ගෙන ඇත. නමුත් අප රටේ සියල්ල දෙමාපියන් මතම රැඳී ඇත. මෙවැනි අවස්ථා දරුවන්ට ලබා දීමෙන් දරුවා තුළ ශ්‍රමයට ඇති වටිනාකම, ශ්‍රම අභිමානය මෙන්ම සෑම රැකියාවකටම ගරු කිරීම වැනි යහපත් ගුණාංග වර්ධනය වේ. එසේම ස්වේච්ඡාවෙන් යම් වැඩක නිරත වුවත් එයද දරුවාට විශාල අත්දැකීමකි. දැනට ශ්‍රී ලංකාවේ මාධ්‍ය අධ්‍යාපනයට පමණක් සීමා වී පවතින මෙම අවස්ථාව අනෙකුත් විෂයන් කෙරෙහි ද අත්දැකීමක් වන්නේ නම් එය සෑම දරුවෙකුටම යහපතකි. මෙහිදී දරුවා වැඩ ලෝකයට විවර කළ යුත්තේ කුමන අවස්ථාවේදී ද යන්න ඉතා වැදගත් ය. මේ නිසා මෙවැනි වැඩ සටහන් කෙරෙහි පවතින සීමා මායිම් ඉවත් කර නව නීති රීති සකසා වැඩ ලෝකය පිළිබඳ අත්දැකීම් පාසල් කාලය තුළදීම අත් විඳීමට අවස්ථාව දරුවාට ලබා දිය යුතුය.

**අපට දියුණු මානව සම්පතක් ඇත. එම සම්පත නිසි පරිදි කළමනාකරණය කරමින් රටට ගැලපෙන වටිනා සම්පතක් බවට පත්කරමින් මේ රටේ සංවර්ධනය සඳහා ඔවුන් එක්කර ගැනීම මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වන අපගේ වගකීමයි. ඒ සඳහා අප සමඟ අත්වැල් බැඳගන්නා මෙන් මේ රටේ තරුණ දූ පුතුන්ට අපි ආරාධනය කරමු.**



සාකච්ඡා කොට සකස් කළේ
රසිකා විජේසිංහ - සංවර්ධන නිලධාරී
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව



## පාසල් වියේදීම වැඩ ලොව අත්දැකීම් ලැබෙන

# වැඩ හුරුව අධ්‍යාපනය

ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ
අධ්‍යාපනපති
**බන්දුල පී දයාරත්න**

**වැඩ හුරුව අධ්‍යාපනය යන්න ජාත්‍යන්තර වශයෙන් හඳුන්වනු ලබන්නේ WEE යන කෙටි යෙදුමෙනි. එයින් අදහස් වන්නේ Work Experience Education යන්න ය. වැඩ හුරුව අධ්‍යාපනය මගින් පාසල් සිසුන්ට, උපාධි අපේක්ෂකයන්ට, වෙනත් වෘත්තීය පාඨමාලා හදාරන්නන්ට හෝ උපාධිධාරීන්ට හා වෙනත් පාඨමාලා නිම කළවුන්ට හෝ වැඩ ලෝකයෙහි සැබෑ වැඩ අත්දැකීමක් ලබා ගන්නට අවකාශ සලකා දෙයි. ලෝකයේ විවිධ රටවල් තම තමන්ට ආවේණික වූ ආකාරයන්ගෙන් වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි.**

1970 දී රැස් වූ මහා බ්‍රිතාන්‍යයේ අධ්‍යාපනඥයන්, කර්මාන්තකරුවන් හා ස්වේච්ඡා සංවිධාන නියෝජිතයන් එක් ව සාකච්ඡා කළේ, මෙම වෙනස් වන සමාජය තුළ තරුණ දරුවන්ගේ අවශ්‍යතා මොනවාද? යන්න ය. මෙය හඳුන්වන්නේ ඩිච්ලි උද්‍යාන සම්මන්ත්‍රණය (Dichley Park Conference - 1970) යනුවෙනි. මෙම සම්මන්ත්‍රණයේ දී අවධාරණය වූ වැදගත් කරුණු දෙකකි.

1. නව යොවුන් දරුවන්ට අනාගත වැඩ ජීවිතය සඳහා සූදානම් වීමට අවස්ථාවක් සලසා දිය යුතු බව
2. වැඩ ජීවිතය ගොඩ නංවා ගැනීම පිළිබඳව හා එය පවත්වා ගෙන යාම පිළිබඳ ව තමාගේ සමාජීය යුතුකම් හා වගකීම් කවරේදැයි හඳුනා ගන්නට දරුවන්ට අවකාශ සැලසීම,

ඒ කරුණු දෙකයි.

ඩිච්ලි සම්මන්ත්‍රණයේ ප්‍රතිඵලයක් වශයෙන් 1971 දී වැඩ හුරුව නියාමක වැඩ සටහන සම්පාදනය කරන ලදී. ඒ අනුව අවුරුදු 14 ට වැඩි දරුවන්ට වර්ග තුනක අත්දැකීම් ලබා ගන්නට අවකාශ සලසා දෙනු ලැබිණි.

1. නේවාසික පාඨමාලා හෝ ක්ෂේත්‍ර අධ්‍යයන
2. ප්‍රායෝගික දායකත්වයක් ලෙස ස්වේච්ඡා සේවය
3. ප්‍රාදේශීය සේවායෝජකයන් වෙතින් වැඩ හුරුව ය.

**මේ ආකාරයෙන් අද වන විට මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය වැනි රටවල් පාසල් සිසුන්ට හා උසස් අධ්‍යාපන ආයතනවල සිසුන්ට වැඩ හුරුව අධ්‍යාපනය ලබා දීමේ ප්‍රමුඛයෝ බවට පත් ව සිටිති. මේ සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ද එම රටවල නීති පද්ධතියට හඳුන්වා දී ඇත. උදාහරණයක් වශයෙන් පාසල් සිසුන් වැඩෙහි යෙදවීම පිළිබඳව අදාළ නීති එම රටවල පනවා ඇත. එපමණක් නොව අර්ධ කාලීන රැකියාවල යෙදෙමින් වියදම් පියවා ගන්නට, උසස් පාඨශාලාවල හා විශ්වවිද්‍යාල ආදියේ සිසුන්ට නීතියෙන් අවකාශය සලසා දී තිබේ.**

තරුණ පරපුරට විවිධාකාරයෙන් වැඩ හුරුව ලබා ගැනීමේ ක්‍රමවේද ඉතා විධිමත් ව ස්ථාපිත කිරීමට දියුණු රටවල් සමත් වී සිටී. එවැනි වැඩ හුරුවක ඇති වැදගත්කම එම රටවල් විසින් නිවැරදිව තක්සේරු කිරීම එයට හේතුවයි. මේ සඳහා විවිධ සංවිධාන හා ආයතන ජාතික හා පළාත් මට්ටමින් ක්‍රියාත්මක වේ. එපමණක් නොව ඒවා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ලෙස ද පවතී. මෙම සියළු ආයතන උනන්දු වන්නේ තම රටේ දරුවන්ට නිසි වයස පැමිණෙන විට රැකියාවකට යාම සඳහා අවශ්‍ය වැඩ හුරුවක් ලබා දීමට ය.

ඇමෙරිකා එක්සත් ජනපදයේ පාසල් සිසුන් අවදානම් සහගත හා සාමාන්‍ය සිසුන් ලෙස වර්ග දෙකකට වෙන් කර ඇත. අවදානම් සහගත සිසුන් යනුවෙන් ඔවුන් අදහස් කරන්නේ පාසලේ සම්මත අධ්‍යාපනය කෙරෙහි උනන්දුවක් නැති, එයින් නිසි ඵල ලැබීමට අවකාශයක් නැති පාසල් සිසුන් ය. ඒ අනුව ඔවුන් සඳහා වැඩ හුරුව ලබා දීමට ඇමෙරිකා එක්සත් ජනපදයේ අධ්‍යාපන බලධාරීහු වැඩි උනන්දුවක් දක්වති. අනෙක් සාමාන්‍ය සිසුන්ට එසේ විශේෂයක් නැත. තමන්ගේ කැමැත්ත අනුව වැඩ හුරුව ලබා ගැනීමට තම ප්‍රදේශයේ යම් කිසි

ආයතනයකට යන්නේ දැයි තීරණය කරන්නේ සිසුන් විසිනි. ඒ සඳහා ඔවුන් විසින් කල් ඇති ව ඉල්ලුම් කළ යුතුය. මෙම කටයුතු සම්බන්ධීකරණය කරන්නට දිස්ත්‍රික් මට්ටමේ ආයතන හා නිලධාරීන් ද ඇත.

වැඩ හුරුව අධ්‍යාපනය යටතේ වර්ග කිහිපයක අවකාශ සැලසේ. එකක් නම් කෙටි කාලීන ව වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහනකට සහභාගි වීමයි. මෙහි දී එම කාලය සතියක සිට සති තුනක පමණ කාලයක් විය හැකි ය.

තවත් අවකාශයක් නම් යම් නිවාඩු කාලවල දී යම් ආයතනයක වැඩ හුරුව ලබා දීමයි. මෙය ගෙවීම් ලබන අවස්ථාවක් හෝ ගෙවීම් නො ලබන අවස්ථාවක් හෝ විය හැකි ය. ගෙවීම් ලබන වැඩ හුරුවක් අර්ධ කාලීන රැකියාවකට සමාන ය. එහෙත් එය ඇත්තෙන් ම අර්ධ කාලීන රැකියාවක් නොව, වැඩ හුරුව අධ්‍යාපනයකි. ඒ අනුව තමන්ගේ කැමැත්ත අනුව හා ආයතනයේ කැමැත්ත අනුව ආයතනය විසින් පවරන කාර්යයන් ඉටු කරන්නට සිසුන්ට සිදු වේ.

**අර්ධ කාලීන රැකියා ස්වරූපයේ වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන් උසස් අධ්‍යාපන ආයතනවල ඉගෙන ගන්නා සිසුන්ට නිතරම විවෘත ය. ඒ අනුව දිනපතා සැන්දෑ කාලයේ දී හෝ තමන් විසින් තෝරා ගත් යම් කාලයක් තුළ හෝ අර්ධ කාලීන රැකියාවල යෙදෙන්නට මෙම සිසුන්ට අවකාශ සැලසේ.**

තවත් අවකාශයක් නම් තම අධ්‍යාපන පාඨමාලාව අවසාන වූ පසු ව වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහනකට සහභාගි වීමයි. එය ඇත්තෙන්ම ආධුනික පුහුණු කාලයක් ගත කිරීමකි. මේ මගින් වැඩ ලෝකය පිළිබඳ සැබෑ අත්දැකීමක් ලබා ගැනීමට අවකාශ සැලසේ. එය කොතරම් ප්‍රයෝජනවත්දැයි කිවහොත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඊළඟ අවස්ථාවේ දී රැකියාවක් ලබා ගන්නට මෙයින් වැඩි අවකාශයක් සැලසේ.

වැඩ හුරුව අධ්‍යාපනයට සම්බන්ධ ඉතා වැදගත් කාර්යයක් නම් දින පොතක් පවත්වා ගෙන යාමයි. වැඩ හුරුව අධ්‍යාපන කාලය කෙටි වුවත්, දිගු වුවත් මේ ආකාරයෙන් දිනපොතක් පවත්වා ගෙන යාම මගින්, තමන්ගේ අධ්‍යයනය ඉතා විධිමත් ලෙස කරන්නට අවකාශය සැලසේ. යුරෝපයේ රටවල මේ ආකාරයේ විවිධ දිනපොත් හා සටහන් පොත් ද පෞද්ගලික අංශයේ ආයතන විසින් සිසුන්ට වැඩ හුරුව සඳහා ස්ථාන සොයා දීම ද සිදු කරනු ලබයි.

## ශ්‍රී ලාංකික අත්දැකීම්

වැඩ හුරුව අධ්‍යාපනය සම්බන්ධව ශ්‍රී ලාංකික අත්දැකීම් ආරම්භ වන්නේ හැටේ දශකයේ දී ආරම්භ වූ වැඩ හුරුව වැඩ සටහන සමඟය. ඒ මගින් පාසල් සිසුන්ට තමන්ගේ අවට ලෝකයේ වැඩ කටයුතු පිළිබඳ සැබෑ අත්දැකීමක් ලබා ගන්නට අවකාශය සලසනු ලැබී ය. එය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිල වැඩ සටහනක් වශයෙන් ක්‍රියාත්මක වූ අතර, ඉතා ජනප්‍රිය වූයේ ය. ඒ සඳහා වැඩ හුරුව ගීතයක් ද නිර්මාණය කර තිබූ අතර, එය ද පාසල් අතර ඉතා ජනප්‍රිය විය. ඒ අනුව සිසුන් පාසලින් බැහැරට පැමිණ අවට තිබෙන විවිධ වැඩ බිම්වල වැඩ කළහ. ගොයම් කැපුහ, ගඩොල් කැපුහ, පාරවල් ඉදි කළහ.

ඒ ආකාරයෙන් ආරම්භ වූ ඉතා වැදගත් අධ්‍යාපන ක්‍රමෝපායක් වූ පාසල් වැඩ හුරුව වැඩ සටහන හැත්තෑව දශකය වන විට පාසල් පද්ධතියෙන් ඉවත් වී තිබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පාසල් සෘජු ව විභාග සඳහා සිසුන් සූදානම් කරන ස්ථානයක් බවට පත් විය.

පසු කාලයේ දී රැකියා සම්පාදනය සම්බන්ධයෙන් සමාජය තුළ විවිධ අර්බුද ඇති විය. එය පාසල් සිසුන්ගේ සිට විශ්වවිද්‍යාල උපාධිධාරීන් දක්වා ද, වෙනත් වෘත්තීය පාඨමාලා හදාරන්නවුන් දක්වා ද පැතිරිණි. ඒ අතර ම වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ වැඩ සටහන් ද රට තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. එහෙත් වැඩ හුරුව අධ්‍යාපනය පිළිබඳ නිසි අවධානයක් යොමු නොවීය.

හැටේ දශකයෙන් පසු වැඩ හුරුව අධ්‍යාපනය කෙරෙහි නැවත අවධානය යොමු වන්නේ එයින් දශක හතරකට පසු එනම් 2006 දීය. ඒ අනුව පාසලේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය උගන්නා සිසුන්ට වැඩ හුරුව අධ්‍යාපනය ලබා දීමේ වැඩ සටහනක් 2007 වර්ෂයේ දී පාසල් 30ක අත්හදා බලනු ලැබිණි. ඒ සඳහා සහභාගි වූයේ 10 වන ශ්‍රේණියේ සිසු සිසුවියන් ය. එහි දී සිදු වූයේ එම සිසු සිසුවියන් පාසල ආසන්නයේ ඇති යම් කාර්යාලයකට සතියක කාලයකට අනුයුක්ත කිරීම ය. ඒ මගින් එම සිසු සිසුවියන්ට සැබෑ වැඩ අත්දැකීමක් ලබා ගන්නට අවකාශ සැලසිණි. එම කාර්යාලවල සන්නිවේදන හා මාධ්‍ය දැනීමක් ලබා ගන්නට ද ඔවුන්ට හැකි විය. මෙම මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන 2007 වර්ෂයේ සිට මේ දක්වා අඛණ්ඩ ව සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය උගන්නා 10 හා 12 වන ශ්‍රේණිවල සිසු සිසුවියන් සඳහා ක්‍රියාත්මක වේ. 10 වන ශ්‍රේණියේ දරුවන් ඕනෑ ම කාර්යාලයකට ද, 12 වන ශ්‍රේණියේ දරුවන් සංවර්ධන කාර්යයන්ට සම්බන්ධ සමෘද්ධි, සණස, සර්වෝදය වැනි කාර්යස්ථානයකට ද අනුයුක්ත කරනු ලැබේ. 2012 වර්ෂයේ සිට මේ සඳහා දිනපොතක්ද ලබා දී අත්හදා බැලීමට කටයුතු සැලසුම් කර ඇත.

පාසල් වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහනේ අත්දැකීම් ඉතා සාර්ථකය. ඒ මගින් නිශ්චය කළ හැකි කරුණ නම්, වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන පාසලේ 10 හා 12 වන ශ්‍රේණිවල සිසු සිසුවියන් සියලු දෙනා සඳහා ක්‍රියාත්මක කළ යුතු බවයි. එපමණක් නොව උසස් අධ්‍යාපන ආයතනවල හා විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයන් හා උපාධිධාරීන් සඳහා වැඩ හුරුව අධ්‍යාපනය සැලසීමේ නිශ්චිත ක්‍රමවේදයක් නීතියෙන් ස්ථාපිත කළ යුතු ය.

**වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන යනු හුදෙක් සිසු සිසුවියන් හෝ තරුණ තරුණියන් හෝ යම් කාර්ය ස්ථානයකට අනුයුක්ත කිරීමක් නො වේ. එය නැරඹීමට යාමක් ද නො වේ. ඒ මගින් සිදු වන්නේ වැඩ ලෝකය පිළිබඳ යහපත් ආකල්ප මෙම සහභාගිකයන් තුළ සංවර්ධනය කිරීමත්, ඒ මගින් තමන් ගේ අනාගත රැකියා ප්‍රවේශය පිළිබඳ වඩාත් හොඳ තීරණ ගැනීමට සුදුසු මානසික පරිසරයක් නිර්මාණය කිරීමත් ය.**



# මාධ්‍ය වැඩ හුරුව පිළිබඳ ප්‍රායෝගික අත්දැකීමක්...

***පාසල් මාධ්‍ය වැඩහුරුව අප අතරට ආවේ 2007 වසරේදී වුවත්, මා එවකට සේවය කළ කඩවත මධ්‍ය මහා විද්‍යාලයේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ඉගෙන ගනිමින් සිටි සිසුන් ඊට සම්බන්ධ වන්නට ඇත්තේ 2011 සිට ය. ඒ මුල් අවස්ථාවේම අප හැමට එය නවමු අත්දැකීමක් විය. එදා අදාළ ගුරුවරයා වූ මටද සිසුන්ටද දෙමව්පියන්ටද විදුහල්පතිට සේම අධ්‍යාපන කාර්යාලයටද මේ සම්බන්ධව ගැටලු ගණනාවක් මතුවිය. මේ වැඩසටහන යෝජනා කරන පරිදි පාසල් දරුවන් නිල ඇඳුමෙන් වෙනත් රක්ෂා ස්ථානයකට යැවීම අපට ආ මුල්ම ගැටලුවයි.***

එහෙත් සුපරීක්ෂාකාරීව කටයුතු කළ අපට ඒ හැම ගැටලුවකටම පිළිතුරු සොයා ගත හැකි විය. අපි පළමු වරට කඩවත තැපැල් කාර්යාලයට කතා කොට තැපැල් ස්ථානාධිපතිවරයා මේ කාර්යයට එකඟ කර ගත්තෙමු අනතුරුව විදුහලේ ආදි ශිෂ්‍ය - එස්.ඩී විජේතුංග ප්‍රකාශන සමාගමට ගොඩ වැදුණෙමු. ඔහු ද ඉතා කැමැත්තෙන්ම අපට උදව් කරන්නට එකඟ විය.

ඒ අනුව සැලසුම් සකස් කරන ලදී. මම දිනපතාම වැඩ බිම් කරා ගියෙමි. දෙමව්පියන් උදේ ඔවුන් රැගෙන විත් හවස යළි භාර ගත්හ. දරුවන්ද මේ නවමු වැඩසටහනට අවතීර්ණ වෙමින් දෛනික සටහන් තැබීමට පටන් ගත්හ. මේ කාර්යයන්ට එවකට කඩවත මැදි විදුහලේ විදුහල්පතිනි එල්.වී.ඩී ලියදපිටිය මහත්මිය දුන් සංවර්ධනාත්මක සහය මෙහිලා ස්තූති පූර්වකව සිහිපත් කරමි.

වැඩසටහනට ආ ළමෝ වේලාවට යෑමට ද ඒමට ද අත්සන් කිරීමට ද පුරුදු වූහ. ඒ අතරම නායකත්වයක් ද මතුකර ගත්හ. සවස් කල වන විට ඔවුන්ගෙන් දුරකතන ඇමතුම් ද නොවරදවා ලදිමි. ඒ අනුව දෛනික කටයුතු සංවිධානාත්මක විය. ඇතැම් විට මේ ගැන පැහැදුණු මවක් මෙන්ම පියෙක් ද තොරතුරු ලබා දුන්හ.

ඉතා වැදගත් කරුණ වූයේ එකිනෙකාට තම දෛනික කටයුතු වාර්තා කරන්නට ලබා දුන් පොතයි. (එය පිටු 40 තනි රූල් පොතකින් භාගයකි.) ඒ අනුව මේ පොත වාර්තා ක්‍රියාකාරකම් හා නිරීක්ෂණවලින් පිරී යන්නට විය. වෙනදාට වැඩ කල්දැමූ දරුවෝ මෙදා එදිනෙදා දේ වාර්තා කරන්නට ඉතා යුහුසුළු වූහ. මේ සටහන් දිනපතාම ඒ ඒ ආයතනයන්හි අධීක්ෂකවරයන්ගේ පරීක්ෂාවට ද ප්‍රශංසාවට ද ලක් විය.

සිසුන්ගේ උනන්දුව ඉතා ඉහළ මට්ටමක වූ අතර ඔවුන්ගෙන් තොරතුරු ලද අනෙක් සිසුන්ගෙන් ද ඉල්ලුමක් ඇතිවන්නට විය. වැඩසටහන දින 5ක් වුවත් - 3 වන දිනය වන විට එය දික් කර ගන්නට ආ ඉල්ලීම් ද මුල සිටම විය. හැමවිටම මේ පිරිස කණ්ඩායමක් ලෙස ක්‍රියාකිරීම ඉතා සතුටට කරුණක් විය.

අප හැම විටම දෙවන වාර විභාගයට පසුව මේ සඳහා සහභාගී වූ නිසා දෙවන වාර නිවාඩුවේ දී අදාළ ව්‍යාපෘතිය සකස් කර ගත හැකි විය. ඒවා පිටපත් කොට අදාළ ආයතනවලටද ලබා දුන් අතර විදුහලේ පුස්තකාලයටද පිටපතක් ලබා දෙන ලදී.

මෙසේ මාධ්‍ය වැඩහුරුව වැඩසටහන සිසු දරුවන්ට ඉතා ප්‍රයෝජනවත්ව සිදු කර ගැනීමට අපට හැකි වූ බව සතුටින් පවසමු. මේ අත්දැකීම මෙරට හැම සිසු දරුවකුටම හිමි විය යුතු එකක් බව මාගේ හැඟීමය.

**ජනක මල්ලව ආරච්චි**
නියෝජ්‍ය විදුහල්පති,
කිරිල්ලවල මධ්‍ය මහා විද්‍යාල




# ඔබේ දරුවා ලෝක ශූරයෙකු කරන්නේ කෙසේ ද?

මහාචාර්ය
දයා රෝහණ අතුකෝරළ

**සිත හා මොළය සංවර්ධනය මඟින් විශිෂ්ටත්වයට : ලෝක ශූර මට්ටමේ ප්‍රබලයන්ගේ රහස් (Excellence through Mind - Brain Development: The Secrets of World Class Performers) නමින් Harold Haruns and Frederick Travis යන දෙපළ විසින් 2016 දී පළ කළ ග්‍රන්ථය මොළය හා මනස වර්ධනයට ගත හැකි හා ක්‍රියාමාර්ග ඒ පිළිබඳ නව දැනුමක් අප වෙත ඉදිරිපත් කර ඇත.**

අප හැම දෙනාටම විශිෂ්ටත්වයට පත්වීමටත්, සතුටින් සිටීමටත් අවශ්‍යය ය. මේ සඳහා විවිධ දෘෂ්ටිකෝණවලින් බලා යෝජිත ක්‍රියාමාර්ග රැසක් පොත් පත්වල ඉදිරිපත් කර ඇත. සමහර ක්‍රියාකාරකම්, සංකීර්ණ හා අවිනිශ්චිත නිසා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව බොහෝ දෙනෙකුට පැහැදිලි වැටහීමක් නැත.

මෙම කතුවරුන් දෙදෙනාගේ මූලික යොමුවීම වනුයේ සාර්ථකත්වය සඳහා වඩාත් ම උපකාරී වන තීරණාත්මක සාධකය කුමක් ද යන්න හඳුනා ගැනීමට හා එය ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න සොයා බැලීමටත් ය. මේ අරමුණ සහිතව ලෝක ශූර මට්ටමේ පිළිගත් දක්ෂයන් එම මට්ටමට ළඟා වීමට බලපාන ලද රහස කුමක් දැයි ඔවුන් විසින් සොයා බලන ලදී. ඒ අනුව ඔවුන් පැමිණි නිගමනය වනුයේ, **කවර වෘත්තියක හෝ කවර ක්ෂේත්‍රයක හෝ කවර ක්‍රියාවලියක හෝ විශිෂ්ටත්වයට ළඟා වීම මූලික හා ප්‍රමුඛ වශයෙන් වශයෙන් ම රඳා පවතිනුයේ, පවතින තනි සාධකය වන්නේ සිත හා මොළයේ ඉහළ සංවර්ධනය සහ සහ සම්බන්ධතාවයි.**

මෙයින් සැබෑ වශයෙන් අදහස් වන්නේ කුමක් ද? ඔවුන්ට පෙනී ගියේ **විශිෂ්ට ශූර ඉදිරිපත් කරන්නන්ගේ මොළය, සාමාන්‍ය දක්ෂතා දක්වන අයට වඩා ක්‍රමානුකූල බවක් හා විවේකීව කටයුතු කරන බවත්ය. විශිෂ්ට ශූරයෙකු වීමට එසේ සීරුවෙන් කටයුතු කරන මධ්‍යස්ථ මට්ටමේ මොළයක් තිබිය යුතු බවයි.** මොළය යනු සංයුක්ත (භෞතික) දෙයකි. මේ නිසා මෙය වැඩි දියුණු කිරීමට කටයුතු කළ හැකි බව ඔවුහු පෙන්වා දෙති.

මෙම පර්යේෂකයන් පෙන්වා දෙන්නේ සාර්ථකත්වය සඳහා අප සතු දැනුම, කුසලතාව සහ අප පවත්වාගෙන යන හෝ අප කුමක් කරන්නේද යන්නට වඩා, අප යනු කවරෙක්ද? යන්න වඩා වැදගත් බවයි. අපගේ බුද්ධියේ හා සිතේ ඇති සමෝධානික බවේ මට්ටම වඩා වැදගත් වන බවයි. අප සතු සිත හා මොළයේ සංවර්ධනයේ ඉහළ තලය නිසා අපගේ දැනුම සහ කුසලතා

වැඩි ප්‍රයෝජනවත් අන්දමට භාවිත කළ හැකි වේ. එසේම අපගේ අන්තර් පුද්ගල සබඳතා වඩා සාරවත් වන බවත්, අප කරනු ලබන ක්‍රියාකාරකම් වඩාත් ඵලදායී වන බවත් පැහැදිලි වේ. කවර හෝ ක්ෂේත්‍රයක දී යමෙකු දක්වන ඉදිරිපත් කිරීමේ මට්ටම ජීවිතයේ හැම අවස්ථාවකදීම වැදගත් වේ. මේ නිසා සිත හා මොළයේ සංවර්ධනය දියුණු කිරීම සඳහා වන දැනුම, ලෝකයේ සිටින සෑම පෙරමුණ ගන්නා අයෙකුට ම නායකයකුට ම එක සේ වැදගත් වේ.

මෙම පර්යේෂකයන් දෙපළ වසර 10කට වැඩි කාලයක් කරන ලද පර්යේෂණ මගින් මොළයේ පරිණත වීම සහ පුද්ගල චර්යාව සහ මනෝ විද්‍යාව සමඟ මොළයේ භාවිතය බලපාන ආකාරය පිළිබඳව කරුණු ගොනු කර ඇත.

මෙම පර්යේෂණයේ දී, ස්වීඩනයේ සහ නෝර්වේ යන රටවල සිටි විශිෂ්ටතම වෘත්තිකයන්, සංගීතඥයන්, මළල ක්‍රීඩකයන් සහ වෙනත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්, සංගීත වාදන ශාලාවල, ක්‍රීඩා පිට්ටනිවල ආදි ලෙස ක්ෂේත්‍රයේ සිටි, මෙම විශිෂ්ටයන්ගේ මොළයේ තරංග ක්‍රියාත්මක වන ආකාරය උපකරණ ආශ්‍රිතව ගණනය කරන ලදි. රටා හඳුනාගන්නා ලදී. එසේම නෝර්වීජියානු රජයේ ඉහළම ව්‍යාපාරික ආයතනවල ප්‍රධානීන් සමග වූ අභියෝගාත්මක, ව්‍යාපාර ලෝකයේ දිගින් දිගට පවතින වෙනස්කම්වලට, නිර්මාණාත්මක වූ විසඳුම් සෙවීමේ දී, වඩාත් බලගතු වන්නේ කවර දක්ෂතාවයක් ද යන්න සොයා බලන ලදි. **මෙම පර්යේෂණ මගින් අවසානයේ දී ඔවුන් ඉදිරිපත් කර ඇති නිගමනය වන්නේ ලෝක ශූර මට්ටමේ නායකයන් වෙත දක්නට ලැබුණ මූලික සාධක පහසුවෙන් ම අන් අයට ද ඉගෙන ගත හැකි බවයි.** ඒ නිසා මෙය ඵලදායී සොයා ගැනීමකි. නූතන පර්යේෂණවලින් හඳුනාගෙන ඇත්තේ උත්තරීතර කූටප්‍රාප්ත අත්දැකීම් (Peak Experience) පිළිබඳව බටහිර මනෝ විද්‍යාවෙහි කරුණු ඉදිරිපත් කර ඇත්තේ මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය මගින් බවයි. ඔහු තම න්‍යායෙහි (Theory of Needs) ඉහළම අවශ්‍යතාව ලෙස නම් කරනුයේ (Need of Self Actualization) - ස්ව සන්තාන පරිපූර්ණ අවශ්‍යතාව හෙවත් ආත්ම සාක්ෂාත් කරන අවශ්‍යතා අවධිය ලෙසය. එසේ වුවත් වෛදික සාහිත්‍යයේ අවුරුදු 3000කටත් පෙර සිට මේ ජයග්‍රහණය හෙවත් අග්‍ර ඵලය ලබා ගත හැකි අන්දම පිළිබඳව සාකච්ඡා සිදු වී ඇත. වෛදික ඉගැන්වීම මඟින් සෑම මිනිසෙකුටම ක්‍රමානුකූලව සිත සංවර්ධනය කිරීම මඟින් උත්තරීතර උත්තර සංවේදනීය අත්දැකීම කරා ළඟා විය හැකි බව පැහැදිලි කර, ඒ සඳහා යෝග්‍ය මාර්ගයද ඉදිරිපත් කර ඇත. ප්‍රායෝගික ක්‍රියාමාර්ග දක්වා ඇත.

එම චින්තනය අනුව ප්‍රමුඛ උත්තරීතර ස්ථරය වනුයේ අතීන්ද්‍රීය සවිඥානික බවයි. එම තලය අහංවාදයට ඉහළින් සිටී. මේ අයුරින් ඉහළ තලයට සිත දියුණු කර ගත් කල්හි සිතීම හා හැඟීම මුළුමණින් ම යටපත් වී මානසික ක්‍රියාකාරී බවකින් තොරව උත්තර පෞරුෂ ලක්ෂණයක් මතු වේ.

**සාර්ථකත්වයට පත් නායකයා පිළිබඳව කළ අධ්‍යයන මඟින් හෙළිව ඇත්තේ ඔවුන්ගේ මේ දක්ෂතාවයට ප්‍රබලම හේතුව වන්නේ ඔවුන්ට තම සිත දියුණු කර ගෙන ඒ කෙරෙහි සිත ඒකාග්‍ර කර ගත හැකි වීමයි.** එම පර්යේෂණයට අනුව ඉහළම දක්ෂතා දැක්වීමේ දී වසර ගණනාවක පාසල් අධ්‍යාපනය මඟින් ලැබිය හැක්කේ ඉහළ ශූරතාවය සඳහා 1% ක වටිනාකමක් පමණි. වැඩ පිළිබඳ අත්දැකීම්වලින් 3% කි. වයස ගත වීමෙන් 0% කි. සාමාන්‍ය වැඩ ලෝකයේ කටයුතු කිරීමට කෙටි කාලීන පාසල් පුහුණුව ප්‍රමාණවත් විය හැකිය. ඒ නිසා දිගු කාලීනව ඉහළ මට්ටමෙන් ඉලක්ක හසුරවා ගැනීමේ දී වෙනත් අයුරකින් මොළය හා සිත ඒකාග්‍ර කිරීමේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් හඳුන්වා දිය යුතු බව ඔවුහු පෙන්වා දෙති.
මෙයට අමතරව තවත් ඉදිරිපත් කර හැකි සාධකයක් වනුයේ අප උපතින්ම ගෙනවිත් ඇති දක්ෂතාවයි. සහජ කුසලතාවයි. **මේ අනුව උපතින් ගෙන වුත් ඇති දක්ෂතා හඳුනාගෙන සිත ඒකාග්‍ර කර සිත හා මොළය ඒකාබද්ධව සමෝධානිකව දියුණු කර ගැනිමෙන්, ඉහළ තලයේ විශිෂ්ටයන් නිර්මාණය කළ හැකි බවයි.**

**මේ අනුව මොළයේ ක්‍රියාකාරීත්වය මඟින් බුද්ධිය උපරිම තලයට දියුණු කරලීමට සිත හා මොළය දියුණු කිරීමේ උපාය මාර්ග (Mind - brain Development) අලුතින් හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතු බව ඔවුන්ගේ තර්කයයි.**

ඉහළම තලයට හෙවත් විශිෂ්ට ශූරයකු බවට අපගේ දරුවන් පත් කරලීමට කටයුතු කළ හැක්කේ කෙසේද? මේ සඳහා ඌණ පූරකයක් ලෙස ක්‍රියාත්මක වන උපාය මාර්ග තුනක් සිත හා මොළය සංවර්ධනය කිරීමට භාවිතා කළ හැකි බව ඔවුන්ගේ නිගමනයයි. එනම්,

01. මානසික (අධ්‍යාත්මික) අභ්‍යාස - (Psychical Experiences)
02. සංගීතය රස විඳීම - Enjoying Music
03. උත්තරීතර බව සඳහා අභ්‍යාස - Transcending Experiences

මානසික (අධ්‍යාත්මික) අභ්‍යාස සහ සංගීතය රස විඳීමේ අභ්‍යාස මඟින්, සිත හා මොළය වර්ධනය කිරීමේ හැකියාවක් ඇත. එහෙත් ඒ සුළු මට්ටමකිනි. **වඩාත් වැදගත් වන්නේ උත්තරීතර තත්ත්වයට ළඟාවීම සඳහා සතිමත් (Mindful) අභ්‍යාස කිරීම ය.** විශේෂයෙන් ම සතිමත් අභ්‍යාස හා භාවනා අභ්‍යාස මගින් මොළයේ බාහික ලලාට ඛණ්ඩිකාවට ලේ ගමන් කිරීම වැඩි දියුණු කර, ඇල්ෆා මට්ටම පහත බැස්ස විට මානසික සංසුන් බව වැඩේ. මෙම ප්‍රශස්ත මට්ටමේදී (එනම් EEG (8-10Hz මට්ටමේ දී) මොළය සමස්තව සමෝධානික ව ක්‍රියාකාරී වේ. මේ අයුරින් උත්කර්ෂයට යළි යළිත් ළඟාවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මොළයෙහි සමෝධානික බව ඉහළ තලයෙන් දවස පුරා ම තබාගත හැකිය. පර්යේෂණ මගින් පැහැදිලිව ඇත්තේ විශිෂ්ටත්වය දැක්වීමේ දී අවශ්‍ය වන ඉහත දක්වන ලද සාධක හතරම, භාවනා හෝ සතිමත් අභ්‍යාස මගින් ප්‍රබල හා ප්‍රශස්ත මට්ටමට ගෙන එන බවයි.

මේ තත්ත්වය කරා ළඟාවිය හැක්කේ කෙසේද? පුරාණයේ ඍෂිවරු මේ තත්ත්වයට නිතරම ළඟා වී සිටියේ කෙසේද? ඒ සඳහා භාවිත කළ හැකි ක්‍රම ශිල්පය වනුයේ සතිමත් බව (Mindfulness)දිගටම රඳා පවත්වා ගැනීමයි. Trascendal Meditation නමින් බටහිර රටවල ඉතා ප්‍රචලිතව ඇති නවීකරණය කරන ලද භාවනා අභ්‍යාස මගින් ද මෙම තත්ත්වයට ළඟාවිය හැකි බව මෙම පර්යේෂකයෝ දක්වති. එම අභ්‍යාස මගින් සිත ඉක්මණින් ම තැන්පත් කළ කල්හි මොළයේ ක්‍රියාකාරී බව උපරිම තලයට නංවාලීම ඉබේම සිදු වේ. එය වෙහෙස රහිතව දියුණු කළ හැකිය. මේ නිසා මොළය උපරිම තලයෙන් සක්‍රීය කර ගැනීමට ඉහත දක්වන ලද මානසික අභ්‍යාස (Psychical Experiences) සංගීතය රසවිඳීම, සහ අධ්‍යාත්ම තලයට ළඟාවීමේ අභ්‍යාස යන ක්‍රියාවලි තුන දියුණු කර ගැනීමට අභ්‍යාස පුරුදු පුහුණු කරගත යුතු ය. මේ සාධක තුන අන්‍යෝන්‍යව ඌන පූරක ලෙස ක්‍රියාකාරී වන නිසා මෙම අභ්‍යාස වර්ග තුනම ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම යෝග්‍ය ය.

මොළයේ උපරිම තලය දියුණු කර ගැනීමට සිත දියුණු කර ගැනීම භාරතීය දාර්ශනිකයන්ගේ ප්‍රමුඛ ඉගැන්වීමකි. බෞද්ධ ඉගැන්වීම වනුයේ ද **"සචිත්ත පරියෝදපනං"** සිත පිරිසිදු කිරීමේ අභ්‍යාස දියුණු කර ගැනීමට ය. ඒ සඳහා කය සංසුන් කරන භාවනා හා සිත පිරිපහදු කරන, සමථ හා විපස්සනා යන භාවනා ක්‍රම ලෙස භාවනා අභ්‍යාස හඳුන්වා දී ඇත.

මේ අනුව කවර හෝ හැකියාවක් උත්තරීතර තත්ත්වයට ගෙන ඒමට නම් පුද්ගලයා උත්තර අධ්‍යාත්ම තත්ත්වයට පත් කළ යුතු ය. මේ සඳහා මොළය නම් වූ (සංයුක්ත) ඉන්ද්‍රිය දියුණු කළ යුතු ය. මොළය දියුණු කිරීමට සිත දියුණු කිරීමේ උපාය මාර්ගය අභ්‍යාස කළ යුතු ය.

ඒ නිසා මිනිස් සිත දියුණු කර මොළයේ ධාරිතාව උපරිමව ඉහළ නංවාලීමට භාවිත කළ යුතු භාවනා, සතිමත් භාවනා ළමා අවධියේ සිට ම පුරුදු පුහුණු කළ යුතු ය. **කවර ක්ෂේත්‍රයක වුව ද විශිෂ්ටයකු වීමට වුව ද සිත දියුණු කරමින් මොළයෙහි උපරිම තලය දක්වා දියුණු කර ගැනීමට අභ්‍යාස කළ යුතු බව නවතම පර්යේෂණවලින් ද හඳුනාගෙන ඇත.**













# හතර වන කාර්මික විප්ලවයේ අභියෝග තරුණ ඔබ ජයගන්නේ කෙසේද?

**ඉතිහාසය පුරා වරින්වර කාර්මික විප්ලව සිදු වූ අතර ඒ සෑම අවස්ථාවක්ම ලෝකයේ වෙනසක් වූ සිදුවීම් පෙළක ආරම්භය වේ. මිනිසුන්, වැඩපරිසරය, ආදී සෑම දෙයකටම මෙම වෙනස බලපෑම් සහගත වූ අතර සෑමවිටම ඊට අනුගත වූවන් හා ලෝකය ඉදිරියට ගමන් කරයි. මේ නිසාම සෑම කාර්මික විප්ලවයක්ම පිළිබඳව ලෝකයේ සියලුදෙනාගේ අවධානය යොමුවන අතර කැමැත්තෙන් හෝ අකමැත්තෙන් සෑම අයකුටම ඊට මුහුණදීමට සිදුවේ. එහෙත් ඒ සඳහා නිසිපරිදි සූදානම්වීමෙන් පමණක් එහි ධනාත්මක ප්‍රතිලාභ අත්කරගත හැකි බැවින් අනාගත වැඩ ලොවට පිවිසීමට සූදානම්වන තරුණ තරුණියන් ඒ පිළිබඳව අවබෝධයෙන් ක්‍රියාකිරීම අත්‍යවශ්‍ය කරුණකි.**

**'හසර' වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යාපනික සඟරාව වෙත නිරතුරුව නවීන විද්‍යාත්මක ලෝකය හා නවීන තාක්ෂණය පිළිබඳ දැනුම බෙදා දෙමින් ඒ සඳහා සූදානම් වීමට තරුණ පරපුර වෙත මග පෙන්වන ජාත්‍යන්තර කළමනාකරණ උපදේශක හා විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයෙකු වූ චාමින්ද හෙට්ටිආරච්චි මහතා මෙවර අප සමඟ සාකච්ඡා කළේ 4වන කාර්මික විප්ලවයේ අභියෝග තරුණ ඔබ ජයගන්නේ කෙසේද යන්න පිළිබඳවයි.**

**හතරවන කාර්මික විප්ලවය යනු කුමක්ද?**

හතරවන කාර්මික විප්ලවය යනු ගෝලීය තාක්ෂණික විප්ලවයක්. එනම් අංකිත ලෝකය (digital world) ජීව විද්‍යාත්මක ලෝකය (biological world) සහ භෞතික ලෝකයේ (physical world) යන තුනේම එකවර වෙනසක් සිදුවීමයි. මෙතෙක් කල් එක් එක් විෂයන් වෙනම වෙනස් වුණා. එක් එක් අය ඒ ඒ විෂයන්වල විශේෂඥතාවය ලබා ගත්තා. එක් විෂයක් පිළිබඳ උගත් කෙනා අනිත් විෂයන් හැදෑරුවේ නැහැ. උදාහරණයක් විදිහට කියනවානම් ICT ඉගෙන ගත් කෙනා සමාජ විද්‍යාව ඉගෙන ගන්නේ නැහැ. නමුත් මේ සිදුවන හතරවන කාර්මික විප්ලවය නිසා සෑම විෂයකටම සීමා මායිම් නැතිවෙලා එකක් වෙනවා. තව අවුරුදු 10 ක් යනකොට දත්ත විද්‍යාව (data science)නැතිව හොඳ වෛද්‍යවරයෙකු වෙන්න බෑ. ඉංජිනේරුවකුට සමාජ විද්‍යාව ඕන වෙනවා. පරිගණක සාක්ෂරතාවය හැම දෙනාටම ඕන වෙනවා. උදාහරණ විදිහට අවයව බද්ද කිරීමේ දී DNA ගැලපෙන අයෙක්ව සොයා ගන්න ඕන ශල්‍යකර්මය කරගන්න නම්. නමුත් ඉදිරියේදී එසේ ඕන වෙන්නේ නෑ. තමාගේම සෛලවලින් අවයව 3D printing ක්‍රමයට මුද්‍රණය කරගන්න පුලුවන්. ඒ සඳහා වෛද්‍ය විද්‍යා දැනුමට අමතරව පරිගණක විද්‍යා දැනුම 3D printing පිළිබඳ දැනුම අත්‍යවශ්‍යයි. මෙම වෙනස සිදුවන වේගය, පරිමාණය, සංකීර්ණතාවය ඉතාම වැඩියි. ඒකීය විදිහට නොවේ වෙනස් වෙන්නේ. මෙය හැම යාන්ත්‍රණයකයම එකසේ බලපානවා.

**කෙනෙක් සිතුවොත් මේ තොරතුරු තාක්ෂණයේම (ICT) වෙනසක් නැත්නම් දියුණුවක් කියලා?**

නෑ මෙය ඊට වඩා වෙනස්. මේ වෙනස්කම මීට කලින් නොදැකපු දෙයක්. ඒ වගේම කොහොම වෙනවාද කියන්න බැරි දෙයක්. විද්‍යාව, කලාව, සමාජ විද්‍යාව, තාක්ෂණය එකිනෙකින් වෙන් කරන්න බැරි තරමට එකක් වෙනවා. මේ නිසා වෘත්තීන් යනු කුමක්ද? වෘත්තීය පුහුණුව යනු කුමක්ද? විශ්වවිද්‍යාලවල පීඨ බෙදන්නේ කෙසේද? යන්න පවා අලුතින් හිතන්න වෙනවා. මේ සිදුවන ගෝලීය තාක්ෂණික විප්ලවය digital, physical, biological යන ලෝක තුන අතර තිබෙන සීමාවන් නැතිවෙලා ඒවා එකිනෙකට සම්බන්ධ වීමෙන් ඇතිවන තාක්ෂණික හැකියාවන් හා නවමානයක්. (Tranformetion) ඒක

සාමාන්‍ය ICT වෙනස් වීමට වඩා පරිමාණය හා සංකීර්ණභාවයෙන් වැඩි තත්ත්වයක්. එවිට හැමදේම අලුතින් අර්ථකතනය කිරීමට සිදුවෙනවා.


### මෙවැනි දෙයක් සිදුවීමට බලපාන හේතු මොනවාද?

මේ ගැන කතාකරන විට අපට ඉතිහාසය ගැනත් කතා කරන්න වෙනවා. 18 වන සියවසේ එංගලන්තය යුරෝපය ආශ්‍රිතව සිදුවන 1 වන කාර්මික විප්ලවය නිසා අතින් කළ බොහෝ දේ යන්ත්‍ර සූත්‍රවලට භාර වුණා. 19 වන සියවස අග හා 20 වන සියවස මුල ඇමරිකාවේ සිදු වු දෙවන කාර්මික විප්ලවය නිසා පෙට්‍රෝලියම් හා විදුලිය භාවිතා කරමින් මහා පරිමාණ කම්හල් බිහි වුණා. කාර් නිපදවීම සිදු වුණා. තුන්වන කාර්මික විප්ලවය ආරම්භ වුණේ 1970 ගණන්වල එය digital revolution එකක්. මයික්‍රෝ චිප් එක සොයා ගැනීමත් සමඟ පරිගණක ක්ෂේත්‍රයේ දැවැන්ත පරිවර්තනයක් සමඟ සමාජ විප්ලවයක් ඇති වුණා. මෙහිදි Telecommunicating Technology, Internet Social media ආදියේ විශාල දියුණුවක් ඇති වුණා. අපි හතරවන කාර්මික විප්ලවය ගැන කථාකරන්නේ මේ පසුබිම තුළ පිහිටා සිටයි. ඕනෑම කාර්මික විප්ලවයක් සිදුවන විට එහි වරප්‍රසාදලාභීන් මෙන්ම ඉන් පාඩු සිදුවන්නන්ද ඉන්නවා. පවතින සමාජ පද්ධතියට බාධා සිදු වෙනවා. උදාහරණයක් නම් කාර් නිපදවු විට අශ්ව කරත්ත නැති වුණා. රික්සෝ එකට පස්සේ ත්‍රීවිල් ආවා. නමුත් තවමත් ඉන්දියාවේ රික්සෝ තිබෙනවා. තුන්වන කාර්මික විප්ලවයෙන් පරිගණක තාක්ෂණය ඉදිරියට ගියත් අන්තර්ජාල පහසුකම්, විදුලිය නැති අය අදටත් සිටිනවා. තාක්ෂණයේ වරප්‍රසාදය හැමෝටම ලැබෙන්නේ නෑ. දෙවන කාර්මික විප්ලවය නිසා මහා පරිමාණ කර්මාන්ත බිහිවුණත් පරිසරයට විශාල ලෙස හානි වුණා. සමානාත්මතාවය නැති වුණා. කම්කරු ධනපති පන්ති බිහි වුණා. නාගරිකරණය සහ බලශක්ති අර්බුද ඇති වුණා.

ඉහත ඇති වු අභියෝගයන්ට විසඳුම් සොයන එක තමා හතර වන කාර්මික විප්ලවයේ වගකීම. කළින් මෙන් විෂමතා ඇති නොවී, මිනිසුන්ට උසස් ජීවන මට්ටමක් ළඟා කරදීම, පුනර්ජනනීය බලය නිපදවීම, වැඩිවන පරිසර දුෂණය නැවැත්වීම, හරිත සංකල්ප දියුණු කිරීම මෙහි එක් වගකීමක්.

### මෙය රැකියා ලෝකයට බලපාන්නේ කෙසේද?

හතරවන කාර්මික විප්ලවය විසින් මිනිසුන් එකිනෙකා අතර සම්බන්ධතා පවත්වන ආකාරය වෙනස් කෙරෙනවා. උදාහරණ ලෙස Brain Science පිළිබඳව කල්පනා කරන්න පුලුවන්. මොළය පිළිබඳ විද්‍යාව යනු මොළය වැඩ කරන්නේ කෙසේද, හැඟීම් ඇති වන්නේ කෙසේද යන්න හදාරන විද්‍යාවයි. දැනට සලකන්නේ මොළය Black Box එකක් හැටියටයි. මොළයේ රහස් සොයන්නට පුළුවන්නම් එය මීට වඩා විද්‍යාත්මකව මිනිසාට හසුරුවන්න පුළුවන්. තවත් උදාහරණයක් කියනවානම් අවයව දායකයින් නැතුව Bio Printing වලින් තමන්ගේම පටකවලින් වකුගඩු වැනි දේ බද්ධ කළ හැකියි. ඒ වගේම රොබෝ තාක්ෂණය භාවිත කරමින් මිනිසුන් නොමැතිව යුද්ධ කිරීමට



හැකියි. කෘත්‍රිම බුද්ධිය නිසා ඇතිවන වෙනස්කම් තුළින් මිනිසා ලෝකයේ බුද්ධිමත්ම සත්වයා යන්නට පවා අභියෝග තිබෙනවා. අන්තර්ජාලය හරහා භෞතික ලෝකය පාලනය කළ හැකි නිසා කලින් කළ නොහැකිව තිබූ බොහෝ දේ කිරීමට හැකියාව ලැබී තිබෙනවා. කම්හල්, නිවාස දුරස්ථ ක්‍රමයට භාවිතා කළ හැකියි. අපි දැනට දකින ස්වභාවික හා කෘත්‍රිම දේ ලෙස හඳුන්වන දේ පවා නැවත අර්ථ කථනය කරන්නට සිදු වේවි.

**ශ්‍රී ලංකාවට, ඇති අභියෝගය කෙබඳුද?**

අපි කැමති උනත් නැතත් මේ වෙනස සිදුවන නිසා ප්‍රමාද වන්නේ නැතිව මේ වෙනසට සුදානම් වීමෙන් මෙහි ධනාත්මක ප්‍රතිඵල නෙලා ගත හැකියි. සමහර දේවල් තර්ජනයක් ලෙස සිතනවාට වඩා අවස්ථාවක් ලෙස සිතිය යුතුයි. ඒ තුළින් 4 වන කාර්මික විප්ලවයේ වින්දිතයන් නොවී පෙරගමන් කරුවන් බවට පත්විය හැකියි.

මේ පිළිබඳව ගැඹුරින් හදාරා වෙනත් රටවල් ඊට මුහුණ දෙන ආකාරය සොයා බලා ඇතිවන වෙනස්කම් හඳුනාගෙන ඒ සඳහා මිනිසුන් සුදානම් කල යුතුයි. ශ්‍රී ලංකාවේ තිබෙන නීති රීති, ප්‍රතිපත්ති හා පුද්ගල කුසලතාවයන් තාමත් පවතින්නේ දෙවන හා තෙවන කාර්මික විප්ලවයට ගැලපෙන ලෙසයි. මේවා සමාලෝචනය කර නැවත සකස් කල යුතුයි. එය රජයේ පමණක් නොව සමාජයද සමඟ එකට එකතු වී කළ යුතු දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් විය යුතුයි.

**වැඩලෝකයට සිදුවන්නේ කවර වෙසක්ද? අපේ තරුණ පරපුර ඊට සුදානම් විය යුත්තේ කෙසේද?**

- මෙහිදී "What is work" යන්න නැවත නිර්වචනය කර ගත යුතු වෙනවා. අපේ තරුණ පරපුර මෙම වෙනස්කම් පිළිබඳව අවබෝධය ලබා ගැනීම හා හැඩගැසීම කළ යුතුවේ. Digitalization, Automation (අංකිතකරණයේ හා ස්වයංක්‍රියකරණයේ) ලොකු වෙනසක් ඇති වෙනවා. දත්ත යනු සමාගම්වලට සම්පතක් මෙතෙක් කල් සම්පත් වුණේ භෞතික හා මූල්‍ය සම්පතුයි. උදාහරණ ලෙස FB ආයතනය දන්නවා ඔබ කවුද කියා, ඔවුන්ට එය භාවිතා කළ හැකියි.

- සාමාන්‍යයෙන් රැකියා සඳහා සලකා නොබැලූ ආබාධිත, විශ්‍රාමික, ගෘහණියන් වැනි අයටත් රැකියා අවස්ථා ලැබෙනවා. එසේම රැකියා සඳහා බඳවා ගැනීමේ කුසලතා ලෙස නිර්මාණශීලීත්වය, කණ්ඩායම් සමඟ වැඩ කිරීම, අන්තර් පුද්ගල සම්බන්ධතා, ගැටළු විසඳීම, නව සොයා ගැනීම්, සහකම්පනය, බහු සංස්කෘතියක් සමඟ වැඩ කිරීම ආදී මිනිසුන්ට පමණක් සුවිශේෂී වූ කුසලතා ඇත්තවුන්ට වැඩි වටිනාකමක් ලැබෙනවා. මන්ද විෂය දැනුම රොබෝ තාක්ෂණයෙනුත් ලබා ගත හැකි බැවිනි.

- දැනට අප වැඩ කරන පැය 8 හා දින 5 වැඩ සතිය ඉදිරියේදී පැය 4 ක් සහ දින 3 ක් බවට පත් වීමට පුළුවන්. (Fixed Location) ස්ථිර කාර්යාලයක වැඩ කිරීම වෙනුවට නිවසේ සිට හෝ වෙනත් ඕනෑම ස්ථානයක සිට අන්තර්ජාලය හරහා වැඩ කිරීම නීත්‍යානුකූල ලෙස පිළිගනී.

- රැකියා ජීවිතය හා පෞද්ගලික ජීවිතය අතර දුරස්ථභාවය අඩුවේ.

- මිනිසුන්ගේ ආයු කාලය වැඩි නිසා විශ්‍රාම ගිය පසුත් සේවයට නැවත බඳවා ගනී. සේවකයින් බඳවා ගැනීමේදී අයදුම්පත් කැඳවන්නේ නැහැ. සමාගම පාසලට ගොස් 7,8 ශ්‍රේණිවල දක්ෂයන් හඳුනා ගන්නවා. ඔවුන්ට ශිෂ්‍යත්ව දෙනවා. පුහුණුවීම් දෙනවා. ඔවුන්ව ඉලක්ක කරනවා. ජර්මනිය දැනටත් මෙය සිදු කරනවා.

මෙවැනි වෙනස්කම් අවබෝධ කරමින් ඒ පිළිබඳ හදාරා ඊට සුදානම් වීමෙන් හතරවන කාර්මික විප්ලවයේ ධනාත්මක ප්‍රතිඵල සමාජයට බුක්ති විඳීමට පුළුවන්.



හසර සඟරාවට ලිපි සපයමින් අප දිරිමත් කළ ශාන්තා මායාදුන්න මැතිණියනි

ඔබට නිවන් සුව!



# ලොවක් දිනූ සිත්තරාවිය...

**මට තාමත් මතකයි. මං ඉස්සෙල්ලාම ඉස්කෝලේ ගිය දවස. කලින්දා කියලා තිබුනෙත් නෑ. තාත්තා උදේම බුලත් අතක් අරගෙන මාව එක්කගෙන ගියා. අපි යන්නේ කැලෑ පාරෙන්. මට හොඳට මතකයි බිම සුදු පාට වැලි තලාව එක්ක උණ පඳුරක් තිබුණා. අපි එතනින් යනකොට උණ පඳුරෙ සිලි සිලි සද්දේ හරියට උණ පඳුර මට සිංදුවක් කියනවා වගේ. මට ඕනීම ඒ සද්දේ අහගෙන ඉන්න. මට අදත් ඒ හඩ ඇහෙනවා.**

මේ ඇගේම වචන... ඇය තම රැකියාව ජීවන වෘත්තිය කර ගනිමින් ඒ සඳහා ජාත්‍යන්තර සම්මාන හිමි කර ගත් සිත්තරාවියකි. 1948 වර්ෂයේ ලංකාදීප පුවත්පතේ ළමා පිටුව සඳහා සිය නිර්මාණ දායකත්වය ලබා දෙමින් වෘත්තිය ජීවිතය අරම්භ කළ ඇය අනතුරුව ලේක්හවුස් ආයතනය උපාලි පුවත්පත් සමාගම, විජය පුවත්පත හා බිංදු පුවත්පත සඳහා ද වෘත්තිය දායකත්වය ලබා දී ඇත. ළමා පොත් කර්තෘවරියක් සහ චිත්‍ර ශිල්පිණියක ලෙස වසර 77 ක කාලයක් විශ්‍රාම ගැනීමකින් තොරව සිය වෘත්තියේ නියැලේ. 1956 වර්ෂයේ රචනා කළ "කුඩ හොරා" කෘතිය වර්තමානය දක්වාම අඛණ්ඩව මුද්‍රණය වන ඉමහත් ජනප්‍රියත්වයට පත් කෘතියකි. එසේම එය ඉංග්‍රීසි, Dutch (ඕලන්ද භාෂාව), ජපන්, චීන, කොරියන්, ස්වීඩන් බසින් ද පරිවර්තනය වී ඇත. 2012 වර්ෂයේ දකුණු ආසියාවේ හොඳම ළමා චිත්‍ර ශිල්පිනිය ලෙස ජාත්‍යාන්තර සම්මානයට පත් ඇය එවැනි වූ සම්මාන රාශියකින් පිදුම් ලැබීමට සමත්කම් දක්වා ඇත. ඇය නමින් කලාකීර්ති සිබිල් වෙත්තසිංහ වෙයි.

**ඔබගේ ළමාවිය පිළිබඳව මතකයන් අලුත් කරනවානම් ?...**

මගේ ගම ගාල්ලේ ගිංතොට. මං ඉපදුනේ 1928 ඔක්තෝබර් 31. මගේ මුල්ම පාසල ගිංතොට මහා විද්‍යාලය. මං පාසල් ජිවිතය පටන් ගන්නේ වයස අවුරුදු තුනෙන්. අපේ තාත්තා Building contract කරන්නේ. අම්මා ගෙදර රේන්ද ගොතනවා. අපේ අම්මාගේ මල්ලි ගෘහ නිර්මාණ ශිල්පියෙක්. ඒ නිසා අපේ අම්මාට වුවමනා වෙනවා මාවත් ගෘහ නිර්මාණ ශිල්පිනියක් කරවන්න. ඒ හේතුව සහ තවත් හේතූන් මත අපේ පවුලම කොළඹට සංක්‍රමණය වෙනවා. එතනින් පස්සේ මගේ පාසල වෙන්නේ බම්බලපිටිය ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය. මම ඉංග්‍රීසි අධ්‍යාපනයට යොමු වන්නේ කොළඹ පැමිණීමත් සමඟ.

**චිත්‍ර ශිල්පිනියක් විදියට ඔබතුමිය ක්ෂේත්‍රයට යොමුවන්නේ කෙසේද?....**

මට මතකයි මං පුංචිම කාලයේ ගෙදර මිදුලේ කෝටු කෑල්ලෙන් චිත්‍ර අඳිනවා. මං හිතන විදියට ඒ හැකියාව පෙර භවයකින්ම එන දෙයක්. දැන් මට වයස අවුරුදු 90ක්. ඒත් තාමත් මං අඳින්නේ පුංචි කාලෙම මං ඇඳපු චිත්‍රමයි. මගේ ශෛලිය ගොඩ නැගුණේ මගේ අනන්‍යතාවයෙන්. ඉස්සර සිංහල අවුරුද්දට කලින් හැම ගෙදරකම අස් කරලා පවිත්‍ර කරනවා. ඔහොම දවසක අපේ ගෙදරත් බිත්තිවල තිබුණ පින්තූර ගලවලා ගෙදර අස් කරමින් තිබුණා. අම්මාත් කැවුම් හදනවා. බිත්තිය දකිද්දී මට හිතුණා මොනවා හරි අඳින්න. මම අම්මා කැවුම් බදින තැනට ගිහින් අඟුරු කෑල්ලක් ගෙනත් සාලේ බිත්තියේ මගෙ උසට දිගටම චිත්‍ර ඇන්ඳා. මේ චිත්‍රය දැකපු තාත්තා - මෙයා හරි ලස්සන වැඩක් කරලා - කියලා මාවත් කරේ තියාගෙන අම්මා ළඟට එක්ක ගෙන ගියා. අම්මා මේ මොකක්ද මේ කරලා තියෙන්නේ කියලා කියද්දී මං බය වුණා. ඒත් තාත්තා ගමේ අයටත් මගෙ චිත්‍රය පෙන්නලා මට ප්‍රශංසා කලා. මගෙ අතින් වුන වැරැද්ද තේරුම් ගත් මං ආයෙ කවදාවත් බිත්තියේ චිත්‍ර ඇන්ඳෙ නෑ. මම අවුරුදු 15 දී මගේම මුහුණ සිතුවමට නගනවා. ඒ කණ්ණාඩියකින් බලාගෙන. දන්නෙම නැතිව කණ්ණාඩිය බිම වැටෙනවා. ඒකෙන් පේන්නේ අමුතුම මුහුණක්. මං ඒක චිත්‍රයට නගනවා. තාත්තා ඒක කලාභවනේ ප්‍රදර්ශනයකට ඉදිරිපත් කර ප්‍රසිද්ධියට පත් වෙනවා. face to broken mirror නමින් එම චිත්‍රය නම් වෙන්නේ. ඒ වගේම නව මඟ පස්වන ශ්‍රේණියේ පොත සඳහා චිත්‍ර නිර්මාණය කිරීමට මට අවස්ථාව හිමි වෙනවා.

**ඔබතුමියගේ නිර්මාණ දරුවන් කේන්ද්‍ර කොට ගෙන නිර්මාණය වෙනවා.**

වර්තමාන ළමා පරපුර පිළිබඳව සියුම් කණගාටුවක් මා තුළ පවතිනවා. ඒ අපගේ කුඩාවිය පිළිබඳව වන මතකයන් සමඟ සැසඳීමේදී. **අද**

**දරුවන් රාමුගත වෙලා ඉන්නේ. ඔවුන් තරගයකට මැදිවෙලා. නිදහසේ පරිසරය විඳින්න, කුරුලු හඬක් අහන්න ඔවුන්ට වෙලාවක් නෑ. එවැනි දරුවකු තුළින් අප අපේක්ෂා කරන මිනිසෙකු බිහි වන්නේ නෑ.** ඇත්තටම චිත්‍ර කලාව වැනි විෂයක් කුඩා දරුවන්ට උගන්වන්න මං කැමති නෑ. ගුරුවරයෙකු යටතට එවැනි විෂයක් ඉගෙන ගැනීම සඳහා දරුවකු යොමු කරවන්න ඕනි වයස අවුරුදු 14 -15 වෙද්දි. අනිත් කාරණය තමයි ළමයින් සතු හැකියාවන් දෙමාපියන් හඳුනා ගැනීම සිදු විය යුතුයි. එසේ නොවන විට සිදු වන්නේ දරුවන් අසරණභාවයට පත්වීමයි. ඔවුන් දෙමාපියන්ගේ අපේක්ෂාවන් ඉටු කර ගැනීමට යොදා ගන්නා පිරිසක් බවට පත් වෙලා. එසේ නොවී ඔවුනට සිය හැකියාවන් ඔස්සේ ඉදිරියට යාමට අවස්ථාවන් සලසා දිය යුතුයි. වර්තමානයේ ජීවත්වෙන දෙමාපියන්ට සාපේක්ෂව මම මගේ දෙමාපියන් වඩා බුද්ධිමත් අය ලෙසට දකිනවා. විශේෂයෙන් මගේ පියා මා සතු හැකියාව හඳුනා ගැනීම චිත්‍ර කලාව තුළ මගේ නම බිහිවෙන්න එක් හේතුවක් ලෙස මා සඳහන් කරන්න කැමතියි.

**දරුවකුගේ නිර්මාණශීලිත්වය ඔහුගේ ඉදිරි වෘත්තිය ජීවිතයට බලපෑම් කරන්නේ මොන විදියටද?**

දරුවෙකු උපතින්ම කිසියම් වූ නිර්මාණශීලිත්වයක් රැගෙන එනවා. එය ඕනෑම වෘත්තියකට අවශ්‍ය වෙනවා. සියුම් හැඟීම් ඕනෑම වෘත්තියකට යොමු වෙන්න උපකාර වෙනවා. වෛද්‍යවරයෙකු, ඉංජිනේරුවරයෙකු වැනි ක්ෂේත්‍රයක නියැලෙන්නෙකුට වුවත් සංගීතය, චිත්‍ර කලාව වැනි සෞන්දර්යාත්මක විෂයයන් ඉගෙනීම තුළින් තම වෘත්තීය සාර්ථකත්වයට ළඟා වෙන්න පුළුවනි. සෞන්දර්යාත්මක විෂයන් දරුවන්ගේ මනස විකසිත කරවන්නක්. ඒ තුළින් ඔවුන් යායුතු ඉදිරි මාර්ගය පැහැදිලිව හඳුනාගන්නවා. අනිත් කාරණය තමයි මිනිස් සිතිවිලි හඳුනාගැනීමේ හැකියාව මේ මඟින් ඔවුනට හිමිවෙනවා. කුමන වෘත්තියක නියැලුනත් එය වෘත්තිය සාර්ථකත්වයට අවශ්‍ය දෙයක් ලෙස මා දකිනවා.

**පාසල තුළින් වැඩ ලෝකයට ප්‍රවිශ්ඨ වන දරුවන් වෙත ඔබතුමිය මොනවගේ පණිවිඩයක්ද ලබා දෙන්නේ..**

ඇත්තටම පාසල දරුවන්ගේ හැකියාවන් නිවැරදි ලෙසින් හඳුනාගන්නා තැනක් විය යුතුයි. තමා සතු හැකියාවන් ඔස්සේ ඔවුන් ඉදිරියට යායුතු වෙනවා. මා කුඩා කළ සිටම දක්ෂතා දැක්වූයේ චිත්‍ර විෂය සඳහායි. මා පාසලේ දී ගණිත විෂය සඳහා අසමත් කම් දැක්වූ අයෙක්. මගේ හැකියාව ඔස්සේ ඉදිරියට ගමන් කල නිසයි මා ක්ෂේත්‍රයේ රැඳී සිටින්නේ. දරුවන් වෙනුවෙන් මෙහිදී මා තවත් දෙයක් සඳහන් කරන්න කැමතියි. ඔවුන් ලෝකයට සොබා දහමට ආදරය කරන පිරිසක් විය යුතුයි. මා සෑම දිනකම උදෑසන පරිසරයට නමස්කාර කරනවා. ඒ මා වෙත එහි ආශිර්වාදය හිමිවන නිසා. පාසල තුළ තරගකාරී විභාග රටාවට පමණක් හුරුවූ පිරිසක් ඉන් පිටත වැඩ ලෝකයට ඉදිරිපත් නොකළ යුතු ලෙස මා දකිනවා. දරුවන් මනස විවෘත කර බලනවානම් ඔවුන්ගේ වෘත්තිය තෝරා ගැනීමේ හැකියාව හිමි වෙනවා. සහජයෙන් අප රැගෙන එන දේ වෘත්තිය ලෙස රැගෙන යා හැකියි. ඉහතදි සඳහන් කළ පරිදි සියුම් හැඟීම් හඳුනා ගැනීමේ හැකියාව දරුවන් තුළ තිබීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස මම දකිනවා.

***මේ වන විට 91 වැනි විය සපුරා ඇති සිබිල් වෙත්තසිංහ මිය සිය වෘත්තීය ජීවිතය සාර්ථක කර ගත් තැනැත්තියකි. එලෙසම වෘත්තිය ජීවිතයට වසර 77 ක කාලයක් ගත වුවද මේ දක්වාම ඉන් විශ්‍රාම නොගොස් දරුවන් උදෙසා නිර්මාණකරණයෙහි ඇය නිරත වන්නීය. ඇය සිය වෘත්තිය හඳුන්වන්නේ මගේ සතුට, මගේ ජීවිතය, මගේ වෘත්තීය ලෙසිනි. තමාගේ වෘත්තිය තුළ සතුටින්, කැමැත්තෙන් හා ආශාවෙන් නිරතවන්නේ නම් එය වෘත්තිය සාර්ථකත්වය සඳහා පාදක වන බව ඇයගේ ජීවන විලාසය තුළින් හඳුනාගත හැකිය. තවමත් නොනැවතී ලෝකයේම දරුවන් එක ලෙස සිතමින් ඔවුන් උදෙසා නිර්මාණකරණයේ යෙදෙන වියපත් වුවද වියපත් නොවූ ඇයගේ කඩිසර දෑතට සහ මනසට තවත් පරපුරක් වෙනුවෙන් නිර්මාණ බිහිකිරීමට දිරිය ශක්තිය හා දිර්ඝායුෂ "හසර" අපි පතන්නෙමු.***



**නිලූෂිකා අතුකෝරළ**
සංවර්ධන නිලධාරී
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව





# අනාගත වැඩ ලෝකය සඳහා නවය ශ්‍රේණියේ කාණ්ඩ විෂයයන් නිවැරදිව තෝරා ගන්න.

***"පාසල් විෂයය මාලාව කාලීන අවශ්‍යතා අනුව සංශෝධනය කරනු ලැබීම විෂයය මාලාවේ ගුණාත්මක භාවයට ඉවහල් වේ" යන මැයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය හා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශ මත 2006/09 චක්‍ර ලේඛණයට අනුව මෙම නව විෂයය මාලාව හඳුන්වා දෙන ලදී.***

ඒ අනුව මේ කාණ්ඩ විෂයයන් හඳුන්වා දීමේ අරමුණුවලින් පැහැදිලි වන්නේ සිසුන් වැඩ ලෝකයට උචිත ලෙස හැඩ ගැස්වීම මෙන්ම ඔවුන්ගේ හසුරු කුසලතා, මෘදු කුසලතා වැඩි දියුණු කිරීම හා දරුවා තුළ පූර්ණ පෞරුෂයක් සකස් කිරීම අපේක්ෂා කරන බවයි. එසේම, මෙහිදී වඩාත්ම වැදගත් වන්නේ සංශෝධනය කරනු ලැබූ මෙම විෂයන් නිවැරදිව තෝරා ගැනිම, දරුවාගේ අනාගත වෘත්තීය දිශානතීන් සඳහා කෙතරම් බලපෑම් සහගත වේද යන්නයි. එබැවින් විෂයය වරණය සඳහා, හඳුන්වා දුන් විෂයන් පිළිබඳව හා මේ වයසේ පසුවන දරුවන්ගේ කායික හා මානසික චිත්ත වේග. ස්වභාවය විමසා බැලිම වටී.

නව වන ශ්‍රේණියේ සිටින නව යෞවනයා තම ජිවිතයේ දෙවන උපත සඳහා සූදානම් වී සිටින අවධියකි මේ. මෙම අවධිය තුළ ඔහුගේ කායික මානසික හා චිත්තවේගික ස්වභාවය සුවිශේෂී වේ. තවද, මේ වකවානුව තුළදී ඔහුගේ ශාරීරික හා බුද්ධි වර්ධනය ඉතා සීඝ්‍රව සිදු වන අතර ඒ හා සමානුපාතිකව ස්ව සංකල්පයද වර්ධනය වේ. එසේම දරුවා තම අනන්‍යතාවය ගොඩ නංවා ගැනීම සඳහා ලබන අත්දැකීම් මහෝපකාරී වේ. ඒ අනුව තමා කවුද? තමන්ට කළ හැක්කේ මොනවාද?, තමාගේ රුචි අරුචිකම් හා තමාගේ ලැදියාවන් දක්ෂතාවන් මොනවාද? ආදී වශයෙන් තමා නිවැරදිව හඳුනාගැනීම, අවබෝධ කර ගැනීම සඳහා දරුවාට සහය ලබා දිය යුතු අවධියකි මෙය. මේ ආකාරයට දරුවා තමා පිළිබඳව ලබන අවබෝධය, ඔහු තුළ වර්ධනය වන ස්ව සංකල්පය ධනාත්මක වේද ඍණාත්මක වේද යන්න සඳහා බලපාන අතිශය තීරණාත්මක සාධකයකි.

1951 දී එලී ගින්ස්බර්ග් සහ ඔහුගේ සගයන් විසින් ඉදිරිපත් කර ඇති වෘත්තීය පිළිබඳව තේරීම දිගුකාලීන ක්‍රියාවලියක් වන අතර එය හදිසියේ හෝ එක් අවස්ථාවකදී කරනු ලබන්නක් නොව වර්ෂ කීපයක් තිස්සේ ගනු ලබන තීරණ මාලාවක ප්‍රතිඵලයක් වේ. මේ අනුව, නව වන ශ්‍රේණියේදී නව යෞවනයා තම කුසලතා සංවර්ධනය කර ගැනීම පිණිස තෝරා ගන්නා කාණ්ඩ විෂයයන් ඔහුගේ අනාගත වෘත්තීය සඳහා බලපෑම් සහගත විය හැක. නමුත් වඩාත් වැදගත් වන්නේ මේ විෂය සංකලනය දරුවාගේ රුචිකම්, ලැදිකම්, හැකිකම්වලට අනුකූලව නිවැරදිව වරණය කළ යුතු වීමයි. ඒ අනුව දරුවාගේ හැකියාවන් ලැදියාවන් පළමුව හඳුනාගත යුතු අතර දෙවනුව මෙම විෂයන් පිළිබඳ වැඩිදුර තොරතුරු සොයා බැලිය යුතුය.

මෙම විෂය මාලාව තුළ හර විෂයන් සහ කාණ්ඩ විෂයන් යනුවෙන් කොටස් දෙකකි.

## හර විෂයන්

01. ආගම
(බුද්ධ ධර්මය, කතෝලික ධර්මය, ක්‍රිස්තියානි ධර්මය, ශෛවනාර්, ඉස්ලාම් ධර්මය)
02. සිංහල භාෂාව
03. ගණිතය
04. ඉංග්‍රීසි
05. විද්‍යාව
06. ඉතිහාසය

සියළුම 10,11 ශ්‍රේණිවල සිසුන් මෙම හර විෂයන් හයම හැදෑරීම අනිවාර්ය වේ. ඉතිරි විෂයයන් කාණ්ඩ තුනක් යටතේ ගොනු කර ඇත. එක් කාණ්ඩයකින් එක් විෂය බැගින් කාණ්ඩ තුනෙන්ම විෂයන් තුනක් තෝරා ගත යුතුවේ. ඒ අනුව සියළුම සිසුන් හර විෂයන් හයක් සහ කාණ්ඩ විෂයන් තුනක් ඇතුළුව විෂයන් නවයක් හදාරනු ලැබිය යුතු වේ.

## කාණ්ඩ විෂයන්

### 1. කලා හා වාණිජ විෂය කාණ්ඩය

01. භූගෝල විද්‍යාව
02. පුරවැසි අධ්‍යාපනය හා පුරවැසි පාලනය
03. ව්‍යාපාර ගිණුම්කරණය හා ව්‍යවසායකත්ව අධ්‍යයනය
04. සම්භාව්‍ය භාෂා හා නූතන භාෂා (පාලි, සංස්කෘති, ප්‍රංශ, ජර්මන්, හින්දි, අරාබි, ජපන් හා දෙවන භාෂාවක් ලෙස සිංහල හා දෙමළ)

### 2. සෞන්දර්යය හා රසාස්වාදය සම්බන්ධ විෂය කාණ්ඩය

01. සංගීතය (පෙරදිග, අපරදිග, කර්ණාටක)
02. නැටුම් (දේශිය, භාරතීය)
03. චිත්‍ර
04. නාට්‍ය හා රංග කලාව
05. සාහිත්‍ය හා රසාස්වාදය (සිංහල/දෙමළ/ඉංග්‍රිසි/අරාබි)

### 3. තාක්ෂණ විෂයය කාණ්ඩය

01. තොරතුරු හා සන්නිවේදන කාණ්ඩය
02. කෘෂි හා ආහාර තාක්ෂණය
03. ධීවර හා ආහාර තාක්ෂණය
04. නිර්මාණකරණය හා තාක්ෂණය
05. ශිල්ප කලා
06. ගෘහ ආර්ථික විද්‍යාව
07. විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය
08. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
09. සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

මේ ආකාරයෙන් නව වන ශ්‍රේණියේදී දරුවන් තෝරා ගත යුතු කාණ්ඩ විෂයන් හඳුන්වා දුන් අරමුණ හා ඒවායේ විස්තරද, ඒ සඳහා ගැලපිය හැකි බුද්ධි දක්ෂතාවන් සහ මෙම විෂයන් හැදෑරීම මඟින් ළගා කර ගත හැකි වෘත්තිය දිශානතින් පිළිබඳ විමසා බලමු.

### භූගෝල විද්‍යාව

තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලීන් පිළිබඳව අවබෝධය ලබා දීම, විවිධ අවස්ථා ග්‍රහණය කර ගැනීම සඳහා, විවිධ සංවර්ධන විකල්පයන්හි බලපෑම් තක්සේරු කිරීමේ හැකියාව වර්ධනය කිරීම හා සම්පත් කළමනාකරණය, පාරිසරික මුලධර්ම පදනම් කරගෙන සමාජ පාරිසරික අන්තර් සබදතා පැහැදිලි කිරීමේ හැකියාව වර්ධනය කිරීම මෙම විෂය හඳුන්වා දීමේ අරමුණයි.

ගණිතමය හා තර්කානුකූල බුද්ධිය, දෘශ්‍ය අවකාශමය බුද්ධිය මෙම විෂයය හැදෑරීම සඳහා අත්‍යවශ්‍ය වේ. උ/පෙළ සදහා භූගෝල විද්‍යාව විෂයය තෝරා ගැනීමේ පහසුව හා විශ්වවිද්‍යාල මට්ටමින් විශේෂවේදී උපාධිය හැදෑරීමට ඉඩ ප්‍රස්ථාව තිබේ. විවිධ වෘත්තීමය අවස්ථා සඳහා යොමු විය හැකිය

උදා - මිනින්දෝරු, ගුරු, භූගර්භ විද්‍යාඥ

### පුරවැසි අධ්‍යාපනය හා පුරවැසි පාලනය

තම හැකියාවන් හා විභවයතා හඳුනාගනිමින් අනාගත ජිවන ඉලක්ක ගොඩ නගා ගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම.

- මනා පෞරුෂයකින් යුතුව සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නිපුණතාව ලබා දීම
- සමාජයේ යහ පැවැත්මට දායක වන සමාජ සංවිධාන හා සමාජ සංස්ථා සමඟ එකමුතුවෙන් කටයුතු කිරීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීමට.
- බහුවිධ සමාජය තුළ එකමුතු බවින් යුතුව ජිවත් වීමට අවශ්‍ය මානව ගුණාංග ලබා දීම මෙහි අරමුණයි.

වාචසික හා භාෂාමය බුද්ධිය, අන්තර් පුද්ගල බුද්ධිය අවශ්‍ය වේ. සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් ඉහළ වෘත්තීමය අවස්ථාවලට යොමු වීමට හැකි අයුරින් කුසලතා අත් කර ගත හැක.

### ව්‍යාපාර ගිණුම්කරණය හා ව්‍යවසායකත්ව අධ්‍යයනය

සරල ගිණුම් ක්‍රම සැකසීමට අවශ්‍ය අවබෝධය ලබා ගැනීම, ව්‍යාපාරික අවස්ථා හා තර්ජන හඳුනා ගැනීමට අවශ්‍ය පරිසර ගවේෂණය, වෙනස්කම් සඳහා යොමු වීම, නිසි අවදානම් ගැනිම වැනි පුද්ගල හැකියා රාශියක් සංවර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ.

ස්ව ශක්තියෙන් නැගී සිට ව්‍යාපාර අවස්ථා සඳහා යොමු වන තරුණ ප්‍රජාව වැඩි කර ගැනීම මෙහි අරමුණයි.

ගණිතමය හා තර්කානුකූල බුද්ධිය ඇති සිසුන්ට වඩාත් ගැලපේ. උ/පෙළ සඳහා වාණිජ විෂය ධාරාව තෝරා ගැනිමේ පහසුව. AAT, චාර්ටඩ් CIM, බැංකු විගණන වැනි වෘත්තීමය පාඨමාලාවලට යොමු වීමේ පහසුව. විශ්වවිද්‍යාල මට්ටමින් විවිධ පාඨමාලා සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ඇත.

## සාහිත්‍යය හා රසාස්වාද විෂයන්

දරුවා තුළ සහකම්පන හැඟීම් වර්ධනය කිරීම මඟින් මානුෂික ගුණාංග තව දුරටත් සංවර්ධනය කිරීම. රසවින්දනය ඇති කිරීම, භාෂා කුසලතා දියුණු කිරීම මෙහි අරමුණයි. වාචසික හා භාෂා බුද්ධිය ඇති අයට ගැළපේ.

## තොරතුරු හා සන්නිවේදනය

පරිගණක ක්ෂේත්‍රයට අදාළව සිසු දරුවා දැනුමින් සන්නද්ධ කිරීමට අවශ්‍ය මූලික පදනම ලබාදේ. තර්කානුකූල හා ගණිතමය බුද්ධිය අවශ්‍ය වේ. විශ්වවිද්‍යාලයේ පරිගණක ක්ෂේත්‍රයෙන් ඉදිරියට යාම, වෘත්තිය පාඨමාලා හැදෑරීම මෙන්ම ඕනෑම කෙෂ්ත්‍රයකින් ඉදිරියට යෑම සඳහා මෙම දැනුම උපකාරි වේ.

## කෘෂි හා ආහාර තාක්ෂණය

සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තයට විද්‍යාත්මක හා තාක්ෂණික මුහුණුවරක් ලබා දීම, ආහාර තාක්ෂණය පිළිබඳව තරුණ පරපුරේ ආකල්ප වෙනස් කරමින් ව්‍යවසායකත්වය ඉලක්ක කර ගත් කෘෂිකර්මයක් වෙත පිවිසීමට මූලික පදනම සකස් කර දීම, කෘෂිකර්මය ලාභදායි ව්‍යාපාරයක් බවට පත් කරලීම සඳහා තාක්ෂණයේ නව ප්‍රවණතා නිෂ්පාදන ක්‍රියාවලියට බද්ධ කිරීමට අවශ්‍ය මූලික පෙළඹවීම පාසල් අධ්‍යාපනය තුළින් ලබා දීම මෙහි අරමුණයි. කායික හා සංචලනමය බුද්ධිය, සොබා දහම් බුද්ධිය අවශ්‍ය වේ. උ/පෙ විද්‍යා විෂය ධාරාව සඳහා තෝරා ගත හැක. HND උපාධි මෙන්ම වෘත්තීය පාඨමාලා රැසක් තෝරා ගත හැක. රැකියා අවස්ථා බහුලය.

## ධීවර හා ආහාර තාක්ෂණය

ධීවර කර්මාන්තය සඳහා තරුණ ප්‍රජාව නැඹුරු කිරීම. මේ ක්ෂේත්‍රය තුළ ඇති රැකියා සුලබතාව හා ආදායම් ඉපයීමේ මාර්ග බහුල වීම නිසා තරුණ ව්‍යවසායකයන් බිහි කරලීම, සොබා දහම් බුද්ධිය, කායික හා සංචලනමය බුද්ධිය අවශ්‍ය වේ. සාගර විශ්වවිද්‍යාලය තුළ ඇති විවිධ කාර්මික පාඨමාලා සඳහා යොමු විමේ හැකියාව පවතී. දේශිය හා විදේශ රැකියා බහුලව ඇත.

## නිර්මාණකරණය හා තාක්ෂණවේදය

ලී වැඩ, පෙදරේරු ශිල්පය, ලෝහ වැඩ, මෝටර් යාන්ත්‍රික ශිල්පය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආදී විෂයන් තුළින් සිසු දරුවන්ගේ නිර්මාණාත්ම චින්තනය නිර්මාණ ශිලී ක්‍රියාකාරකම් වර්ධනය කිරීම අපේක්ෂා කරයි. සිසුන්ගේ දක්ෂතා විවිධ තාක්ෂණික ක්ෂේත්‍ර ඔස්සේ මතු කර ඉන් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වන පරිදි විෂය මාලාව සකස් කර ඇත.

දෘෂ්‍ය අවකාශමය බුද්ධිය. කායික සංචලනමය බුද්ධිය, ගණිතමය හා තර්කානුකුල බුද්ධිය අවශ්‍ය වේ. වෘත්තිය පුහුණු ආයතනවලට යොමු වීමෙන් පසුව N.V.Q මට්ටම් ලබා ගත හැකිවේ. මේ තුළින් සිසුවාට රැකියා ලෝකයට ඉතා ඉක්මනින් ප්‍රවිශ්ඨ වීමෙන් පසුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට ඇතුළත් වී උපාධිය දක්වා අධ්‍යාපනය ලැබීමට හැක.

## ශිල්ප කලා

පේෂ කර්මාන්තය, මැටි ශිල්පය, යන විෂයන්ට අමතරව විසිතුරු අත්කම් නිර්මාණද මෙම විෂයන්ට ඇතුළත්ව පවතී. ශිල්ප කලා විෂය නිපුණතාවයෙන් වැඩ ලෝකය ජය ගැනීම සඳහා අනාගත ව්‍යවසායකත්වයට මං හෙළි කිරීම. කාලීන අවශ්‍යතාවයන්ට අනුව විසිතුරු නිර්මාණයන්ට යොමු කිරීම මෙහි අරමුණයි. දෘෂ්‍ය අවකාශමය බුද්ධිය, ගණිතමය හා තර්කානුකූල බුද්ධිය, කායික හා සංචලනමය බුද්ධිය, ව්‍යවසායකත්ව හැකියා වර්ධනය කිරීම සිදුවේ.

## ගෘහ ආර්ථික විද්‍යාව

ගෘහ කළමනාකරණයට අයත් විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රායෝගික සහ ගැටලු විසඳීමේ ශිල්පීය ක්‍රම උපයෝගී කර ගැනීමේ හැකියාව මගින් සිසුන්ගේ ආත්ම විශ්වාසය හා ආත්මාභිමානය ගොඩ නැගීම, ගෘහ ආර්ථික විද්‍යා විෂය හා බැඳි විවිධ වෘත්තීමය අවස්ථා පිළිබඳ දැනුවත් බවක් ලබා දීම, යහපත් ආකල්ප සහ සාරධර්ම වර්ධනය කිරිම මගින් පුද්ගල සහ සමාජ සංවර්ධන ඇති කිරිම සිදුවේ.

උ/පෙළ සදහා ගෘහ ආර්ථික විද්‍යා විෂය හැදෑරිමට පහසු වේ. හෝටල් පාසල ආශ්‍රිතව විවිධ පාඨමාලාවලට යොමු වීමේ අවස්ථාව ඇත.

## විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය

යතුරු ලියනය හා ලඝු ලේඛනය විෂයන් නවිකරණය කිරිමෙන් සකසා ඇත. කායික හා සංචලනමය, බුද්ධිය අවශ්‍ය වේ. පාර්ලිමේන්තු හා උසාවි වැනි ස්ථානවල තවමත් මේ සඳහා රැකියා අවස්ථා ඇත.

## සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය

ක්‍රියාශීලි, නීරෝගි තාප්තිමත් බවින් යුතු ජීවිතයක් ගත කිරිම සඳහා අවශ්‍ය වන දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමට අවශ්‍ය නිපුණතා ලබා දීම තුළින් සහෘදයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරිම ජිවිත අභියෝගවලට ධනාත්මකව හා සාර්ථකව මුහුණදීම වැනි නිපුණතා ලබාදීම අපේක්ෂා කෙරේ. කායික හා සංචලනමය බුද්ධිය අවශ්‍ය වේ. ක්‍රීඩා කෙෂ්ත්‍රයේ වෘත්තිය අවස්ථා ඇත.

## සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

විචාරශීලි ග්‍රාහකත්වය හා මාධ්‍ය වෘත්තීය මාර්ගෝපදේශය යන තේමාවන් මුල් කර ගෙන එම තේමාවන්ට අදාළ නිපුණතා සංවර්ධනය කිරීම මූලික අපේක්ෂාව වේ. එසේම පන්ති කාමරයෙන් බැහැරව ඉගෙනුම් අවස්ථා ලබා ගැනිමට රුචි කරන සිසුන්ට මෙම විෂය හැදෑරිම අගනා අවස්ථාවකි. උපාධිය දක්වා හැදෑරීමට හැක. ජන මාධ්‍ය හා කලා කෙෂ්ත්‍රය තුළ රැකියා අවස්ථා බහුලය.



**බී.එම්.එන්. පුෂ්ප කුමාරි**
මානව සම්පත් සංවර්ධන නිලධාරී
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව




# වැඩ ලෝකයට පිවිසීමට

## පුරවැසි අධ්‍යාපනයෙන් අත් වැළක්

***උදාවී ඇති වැඩ ලෝකය අතිශය තරඟකාරී එකක්. නිපුණතා පිරි පුද්ගලයන්ට එහි වැඩි ඉඩකඩක් විවෘතයි. ඒ නිසා පාසල් අධ්‍යාපනය නිම කිරීමට***

***පෙරම වැඩ ලෝකය සඳහා හොඳින් සූදානම් වීම වර්තමානයේ ඉතා වැදගත්. වැඩ ලෝකයට ගැලපෙන පරිදි නිපුණතා පිරි පුද්ගලයෙකු ලෙස පාසලෙන් නික්ම යන්නට පුළුවන් නම් එය වැඩ ලෝකයට පිවිසීමට මහෝපකාරි වෙනවා.***

මේ අනුව තම හැකියාවන් හා විභවතාවයන් හඳුනාගෙන අනාගත ජීවන ඉලක්ක ගොඩ නඟා ගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීමත්, වැඩ ලොවට අවශ්‍ය පරිදි පෞරුෂ සංවර්ධනය හා සමාජ සංස්ථා සමඟ කටයුතු කිරීමටත් හැකි කුසලතා දියුණු කිරීම අරමුණු කොට ගනිමින්, හඳුන්වා දී ඇති පුරවැසි අධ්‍යපනය විෂය තෝරාගෙන වැඩ ලොවට පිවිසීමට සිටින සිසු දරුවන්ට ලබා දෙන අත්වැල පිළිබඳවයි ඔබ දැනුවත් කරන්නේ.

රැකියාවක්/වෘත්තියක් කිරිමට බලපාන මූලිකම කාරණයක් වන්නේ තමන්ගේ කැමැත්තයි. එමෙන්ම අපේක්ෂිත රැකියාවෙන්/ වෘත්තීයෙන් තමන්ට හොඳ ආදායමක් උපයා ගැනීමට හැකියාවක් තිබේද යන්න තවත් වැදගත් කරුණක්. එමෙන්ම තම රැකියාවෙන් / වෘත්තීයෙන් සමාජයට සේවයක් කිරීමට ලැබීමත් ඉතා වැදගත්. රැකියාවක් / වෘත්තියක් කිරිමෙන් අලුත් අලුත් දේවල් ඉගෙන ගැනීමට මෙන්ම හොඳ සමාජ තත්ත්වයක් ගොඩනගා ගැනීමට පුළුවන්. ජාතික ආර්ථික සංවර්ධනයට ඉන් ලැබෙන්නේ මහඟු පිටිවහලක්. මේ නිසා රැකියාවක්/ වෘත්තියක් සඳහා යොමු විම, ඊට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කර ගැනීම පාසල් අධ්‍යාපනය ලබන ගමන්ම කළ යුත්තක්. කෙනෙකු වැඩ ලෝකයට

පිවිසීමේදී කිසියම් රැකියාවකට/වෘත්තියකට කැමැත්තක් තිබීම පමණක් ප්‍රමාණවත් නැහැ. ඊට පෙරාතුව තමන්ගේ දක්ෂතා, දුර්වලතා, තමන්ට ඒ සඳහා තිබෙන ඉඩ ප්‍රස්ථා, සහ ඇති විය හැකි තර්ජන හෝ මුහුණ දීමට සිදු විය හැකි අභියෝග පිළිබඳව සොයා බැලීම අත්‍යවශ්‍යයි.

ඒ වගේම වැඩ ලෝකයේ රැකියා/වෘත්තීන් විවෘතව පවතින කෘෂිකාර්මික, කාර්මික, සේවා යන අංශ පිළිබඳව අවධානය යොමු කිරීම කළ යුතුයි. රාජ්‍ය/අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ පවතින රැකියා පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත්. තමා වඩාත් කැමති දේශියව තම රටේ රැඳී සිටිමින් රැකියාවක් කරන්නද? නැත්නම් විදේශ රටකට ගොස් රැකියාවක්/වෘත්තියක් කරන්නද? යන්න තීරණය කළ යුතුයි. විදේශීය රටකට යනවා නම් ඊට ගැලපෙන පරිදි අධ්‍යාපන කටයුතු කිරීම, ඒ සඳහා පහසුවක් විය හැකියි. තමන් ස්වයං රැකියාවක නිරත වෙනවාද කියලා තීරණය කරන්නත් පුළුවන්.

**කුමන ක්ෂේත්‍රයක කුමන විදියේ රැකියාවක්/වෘත්තියක් කිරීමට අපේක්ෂා කළත් මුලින්ම සිහි තබා ගත යුතු දෙයක් තමයි "ශ්‍රමාභිමානය" පිළිබඳව සිතීම. වැඩ ලෝකයේ තිබෙන කිසිම රැකියාවක්/වෘත්තියක්, එකක් අනෙකට වඩා උසස් හෝ පහත් වන්නේ නැහැ. සෑම රැකියාවකටම සමාන පිළිගැනීමක් හා ගරුත්වයක් තිබෙනවා. එය ශ්‍රමාභිමානයයි.**

ඒ පිළිබඳව සිතා තමා කරන රැකියාව/වෘත්තිය කුමක් වුවත් සතුටින්, කැපවීමෙන් එහි නිරත වීම තමයි වැදගත් වන්නේ. ඊට අවශ්‍ය මානසික මෙන්ම කායික සූදානම ඇති කර ගැනීම අත්‍යවශ්‍යයි.

එමෙන්ම වැඩ ලෝකයට ප්‍රවිශ්ට වීමට අපේක්ෂා කරන (රාජ්‍ය/අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ) ඕනෑම කෙනෙකු මූලිකව සොයා බැලිය යුතු කරුණු කිහිපයක් තිබෙනවා. ඒක්, ඒක් අංශවල පවතින රැකියා ඉඩ ප්‍රස්ථා, අවශ්‍ය වන අවම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, අපේක්ෂා කරන විශේෂ දක්ෂතා, වෙනත් සුදුසුකම් පිළිබඳව මනා අවබෝධයක් ලබා ඉන් පසු ඒවාට ගැලපෙන පරිදි තමන්ගේ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය පුහුණුව සපුරා ගැනීම සැලසුම් කරගත යුතුයි.

වැඩ ලෝකයට පිවිසීමට ප්‍රථම පාසල් අධ්‍යාපනය ලබන කාලයේදී තමන් කළ යුතු වැඩ බොහෝමයක් තිබෙනවා. එයින් වැදගත්ම එකක් තමයි තමන්ගේ පෞද්ගලික ගොනුවක් පවත්වා ගෙන යාම. කාලීනව වෙනස් වන තාක්ෂණික උපකරණ භාවිතයට හුරුවීමත් අතිශ්‍යයින්ම වැදගත්. එමෙන්ම රැකියාවක් සඳහා නිවැරදිව අයදුම්පතක් යොමු කිරීම,රැකියා ඉල්ලුම් පතක් නිවැරදිව සම්පූර්ණ කිරීම, රැකියා ඇබෑර්තුවක් සඳහා සිත් ගන්නා සුලු ලිපියක් ලිවීම, ජීව දත්ත පත්‍රිකාවක් නිවැරදිව සකස්කර ගැනීම ආදී දේ පිළිබඳව ඉතා හොඳ පුහුණුවක් පාසල් වියේදී ලබා ගත යුතුයි.

වැඩ ලෝකයට පිවිසීමට ප්‍රථම සාර්ථකව සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීමට අවශ්‍ය පුහුණුව ලබා ගැනීමත්, කුසලතා සංවර්ධනය කර ගැනිමත් අත්‍යවශ්‍යයි.

හොඳ කාල කළමනාකරණයක් ඇති කර ගැනීමත්, නිවැරදි පෞද්ගලික මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගැනීමට පුහුණු වීමත් පාසල් කාලයේදීම කළ යුත්තක්.

වැඩ ලෝකයට පිවිසෙන කෙනෙකුට තම වෘත්තීය ජීවිතය මෙන්ම පෞද්ගලික ජීවිතයත් සමබරව පවත්වා ගැනීම ඉතා වැදගත්. එයත් පාසල් කාලයේදීම පුරුදු පුහුණු කළ යුතු වෙනවා.

සාර්ථකව වැඩ ලෝකයට පිවිසීම සඳහා ඉහත සාකච්ඡා කල සියලු කරුණු පාසල් කාලයේම දරුවන්ට පුහුණු කරන ඉතා වැදගත් විෂයක් ලෙස පුරවැසි අධ්‍යාපනය හැඳින්විය හැකියි.


**ඒ.එල්.එස්.අබේවික්‍රම.**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.
(ව්‍යාපෘති නායක පුරවැසි අධ්‍යාපනය)
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය මහරගම.



# රටක ව්‍යවසායකයන් බිහිවීමේ මූලාරම්භය පාසලයි



**ආර්.එන්. වීරසිංහ**
පීඨාධිපති
ව්‍යවසායකත්ව අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

## එදා සහ අද ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය

**වසර 2500ක පමණ ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකාව එදා ස්වයංපෝෂිත රාජ්‍යයකි. ගොඩ මඩ ඉඩම් හා අහස් දිය කිසි විටෙකත් අපතේ නොහැරී, නිෂ්පාදන අතිරික්තයක් පවා පැවතුණ, දෙපයින් නැගී සිටි අභිමානවත් ජාතියක් ලෙස එදා ශ්‍රී ලංකාව පත්ව තිබුණි. වරින්වර විදේශ ආක්‍රමණ ඇතිවුවද, බොහෝ කල් යටත් විජිතයක් ව පැවතියද, 1948 දී මේ රට නිදහස ලබන විට ශක්තිමත් වැවිලි කර්මාන්තයක්, හොඳ මාර්ග පද්ධතියක්, වාරි කර්මාන්ත සහිත හොඳ ආර්ථික ශක්තියක් තිබු රටකි ශ්‍රී ලංකාව. විශේෂයෙන් 1948 වන විට ආසියාවේ බොහෝ රටවල් කොරියාව, සිංගප්පූරුව වැනි රටවල්වලටත් වඩා ඉතා හොඳ ආර්ථික මට්ටමකින් ශ්‍රී ලංකාව පැවතිණි.**

එහෙත් වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ඇත්තේ මීට හාත්පසින්ම වෙනස් වූ තත්ත්වයකි. විදේශ ණය ආධාර නොමැති නම් මාස 3ක් ඇතුළත කඩා වැටීමට තරම් භයානක ආර්ථිකයක් මේ වනවිට රට තුළ නිර්මාණය වී ඇත. බරපතල ආර්ථික අර්බුදයක් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව හංවඩු ගැසී අවසන් ය. ඒක පුද්ගල ආදායම හා දල ජාතික නිෂ්පාදනය ලෝකයේ අනිකුත් රටවල් හා සාපේක්ෂව සැහෙන මට්ටමකින් පහළ වැටුණු රටක් ලෙස අද ශ්‍රී ලංකාව සැලකිය හැකිය. එහෙත් මේ වන විට මැලේසියාව, සිංගප්පූරුව, තායිලන්තය වැනි රටවල් ඉතාම සමෘද්ධිමත් රටවල් බවට පත්ව ඇත.

## මෙසේ වුයේ ඇයි?

අප රට වසර පුරාවටම ඉර පායන ස්වාභාවික සම්පත්වලින් අනූන රටකි. එනම් භූමිය සම්පතේ කිසිදු හිඟයක් නැත. ශ්‍රමය අතින් ගත්විට පෙර කී සමෘද්ධිමත් රටවල අපට තරම් ශ්‍රම සම්පතක් තිබුණේ නැත. බුද්ධිමත් හා ශාරීරික ශක්තියෙන් හෙබි හොඳ ශ්‍රම බලකායක් අප රටේ සිටි බව ඉතිහාසය සාක්ෂි දරයි. එනම් විශාල වාරි කර්මාන්ත ගොඩනැගිලි ඉදි කිරීම් නිමවා ඇත්තේ අප රටේ ජනතාවයි. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය තිබුණද අප රටට නො තිබුණ වැදගත්ම නිෂ්පාදන සාධකය වන්නේ ව්‍යවසායකත්වයයි. ජපානය සෝනි, හොන්ඩා, මිට්ෂුබිසි, ටොයොටා වැනි දැවැන්ත ව්‍යවසායකයින් බිහි කල අතර එම සමාගම්වලින් එහි ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය අති මහත්ය. එසේම කොරියාව වැනි ඉතා පහළ තලයක පිහිටි රාජ්‍යයන් පවා අද ඉදිරියට පැමිණ ඇත්තේ LG වැනි සමාගම් බිහි කල නිසයි. මෙවැනි ලොව පුරා ව්‍යාප්ත සන්නාම (brand name) සහිත ව්‍යාපාර අපිට නොමැත. ඒ ව්‍යවසායකත්වය අප රටේ දියුණු නොවූ බැවිනි.

රටක් දියුණුවීමට නම් ආර්ථික වශයෙන් දියුණුවීම අත්‍යවශ්‍ය කරුණකි. එසේ නොවුනහොත් එම රට සාමාජීය වශයෙන් පිරිහීමට පත් වේ. අප රටේ පැවති ත්‍රස්තවාදී ප්‍රශ්නය මේ රටේ සාමාජීය ප්‍රශ්නවලට දැඩිව බලපෑම් එල්ල කලද ජපානයටත් යුධ තත්ත්වයන් වලට මුහුණු දීමට සිදු විය. එහෙත් එම රට යුද්ධය හේතුවක් කරගත්තේ නැත.

රටක ආර්ථිකය අස්ථාවර වීම නිසා අධ්‍යාපනය, සුභසාධනය, වැනි දේට වියදම් කිරීමට මුදල් අඩුවේ. මේ නිසා සමාජය පිරිහී දිවි නසා ගැනීම්, කැරලි කෝලහාල, තරුණ අසහනය වැඩි වේ. අප රට ද 2009 වසරේ යුද්ධය හමාර කලත් ඉන් පසුත් දිගින් දිගටම පැවති අස්ථාවර තත්ත්වය ඉදිරියට ගෙනයෑම සිදු කර ඇත. විදේශ ව්‍යාපාර මේ රටේ ස්ථාපිතව තිබුනද ඔවුන් ප්‍රාග්ධනය උත්පාදනය කරන්නේ මේ රටට නොවේ. මේ රට ණය බර ආර්ථිකයක් බවට පත් වී ආනයන වියදම ඉහළ ගොස් අපනයන ආදායම වැඩි නොවී අවාසි සහගත වෙළෙඳ ශේෂයක් දිගින් දිගටම පවත්වාගෙන යයි. මේ නිසාම වර්තමානයේ ජීවත්වන මිනිසුන් වූ අපට ඇති ලොකුම වගකීම වන්නේ මේ රට අනාගත පරපුරට වාසය කිරීමට සුදුසු රටක් බවට පත් කිරීම යි.

## එය කළ හැක්කේ කෙසේද?

මෙහිදී වර්තමානයේ ජීවත්වන පරම්පරාව ප්‍රයෝජනයට නොගන්නා අති විශාල ව්‍යාපාරික අවස්ථාවන් හඳුනාගෙන ඒවා නිර්මාණශීලි ලෙස භාණ්ඩ හෝ සේවා බවට පත් කිරීමටත් රටේ ජනතාවගේ අවශ්‍යතා සපුරන අතරම ලෝකයට අලෙවි කිරීමට කටයුතු කිරීමත් සිදුකරමින් අපගේ ආර්ථික අස්ථාවර භාවය අවම කරගත යුතුය. එසේ නොවුනහොත් අපගේ පැවත්මට තර්ජනයක් වනවා මෙන්ම අප ලොවෙන් යදින්නන් බවට පත්වනු නොඅනුමානය. අතීතයේ චීනය ඉතා දුගී රටකි. නමුත් නිවැරදි දර්ශනයක් ඔස්සේ තමන්ට අවශ්‍ය දේ නිෂ්පාදනය කිරීමට චීනය උත්සාහ කරන ලදී. ප්‍රයෝජනයට ගත හැකි දේ නැවත නැවත භාවිතයට ගනිමින් ඒවා වෙළෙඳපොළ වටිනාකම් බවට පත් කරමින් මුළු ලොවටම දැවැන්ත වෙළෙඳ පොළක් නිර්මාණය කිරීමට චීනයට හැකි විය.

අප රටේ වර්තමාන තරුණ පරපුර විරැකියාවෙන් පෙලුනද නිර්මාණශීලි බව අවදානම, භාරගැනීම, මහන්සි වී වැඩ කිරීම, කැපවීම, අභියෝග භාර ගැනීමට ඇත්තේ දැඩි අලස කමකි. බොහෝ දෙනෙකු උදාසීන හා ලෝකයට ප්‍රදර්ශනාත්මකව සිටීමේ අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා රැකියා සොයන්නන් විනා රැකියා නිර්මාණය කරන්නන් ලෙස ඉදිරියට යන්නේ නැත.

මේ නිසාම අපේ තරුණ තරුණියන් මේ රටේ පවතින සම්පත් හඳුනාගෙන ඒවා අපතේ යෑමට නොදී ඒවාට වෙළෙඳ පොළ වටිනාකම් එකතු කරමින් ධනය රැස් කිරීමට කටයුතු කළ යුතු වේ. තමන්ගේ අපතේ යන කාලය වැය කරමින් කිසිම ප්‍රාග ධනයක් නොමැතිව පවා ව්‍යාපාර ගොඩ නැගිය හැකි බව ඔවුන් අවබෝධ කරගත යුතුය. උදාහරණ ලෙස අප විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු අපතේ යන වීදුරු, ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය එකතු කිරීමේ ව්‍යාපාරයක් අරඹා බොහෝ සාර්ථක වී ඇත. පොල්කටුව පවා ebay මඟින් හොඳ මිලකට විකුණා ගත හැකි බව දන්නේ අතලොස්සකි. උනන්දුව, කැපවීම, දියුණුවීමට, කැමතිවීම, අනුන් යටතේ සිටිනවාට වඩා ආත්මාභිමානයකින් තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සහ තවත් අයට රැකියා ලබාදීමටත් හැකි තරුණ පරම්පරාවක් අප නිර්මාණය කර ගත යුතුයි. රටේ පොදු ප්‍රශ්න විවේචනය කරමින් කාලය කා දැමීමට වඩා අපේ රටේ සිටින මිලියනයක් ජනතාව එක ඩොලරයක් හෝ උපයන්නේ නම් එය රටට විශාල අත්වැලකි. දේශීය වශයෙන් නිෂ්පාදනය කරමින් අපේ අවශ්‍යතා සපුරා ගන්නේ නම් ආනයන වියදම ද පහත හෙළිය හැකියි.

ව්‍යාපාරයක් ආරම්භ කිරීම මහා පරිමානයෙන් විය යුතු නැත. එය ඉතාම සුලුවෙන් වුවද ස්වයං රැකියාවක් ලෙස ඕනෑම අයෙකුට ආරම්භ කළ හැකිය.

**අප රටේ ස්වයං ව්‍යාපාර ආරම්භ කිරීම සිදුවුණත් එය දැවන්ත ව්‍යාපාර බවට පත් වීමේ ප්‍රවණතාවය ඉතා අඩුය. මන්ද තමන් ඉදිරියට යාමට නම් ඒ සඳහා විධිමත් ක්‍රමවේද අනුග මනය කිරීමට ව්‍යාපාරිකයා සූදානම් නොමැති බැවිනි.**

මෙහිදී තම ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට නම් ලියාපදිංචි කිරීම්, විධිමත් ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම, ව්‍යාපාර කළමනාකරණය යොදා ගැනීම, විධිමත් ගනුදෙනු පවත්වාගෙන යාම,වැදගත් කරුණකි. මෙයින් තම ව්‍යාපාරයට ඇති පිළිගැනීම, නීත්‍යානුකූලභාවය මෙන්ම ඉදිරියට යෑමේ වපසරිය ද වැඩි වේ.

ස්වයං ව්‍යාපාරයක් කිරීම හා ව්‍යවසායකත්වය යනු දෙකකි. ව්‍යාපාරිකයා පවතින දේ කළත් ව්‍යවසායකයා යනු අලුත් අලුත් දේ සොයා යන අයෙකි. අන් අය අභිබවා ඉදිරියට යෑමට කැමති අයෙකි. අපට අවශ්‍ය ව්‍යවසායකයන්ය. කුමාරතුංග මුනිදාස ශූරීන් පවා පවසා ඇත්තේ "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී"ලෙසයි. ව්‍යවසායකයන් සිටිනා රටකට වෙළෙඳපොළ ජයග්‍රහණලබා ගැනීමට නව නිෂ්පාදන කරමින් ධනය උත්පාදනය කිරීමට හැකියාව ලැබේ.

**ලෝකයේ දැවැන්ත ව්‍යාපාරිකයන් මේ වන විට අපිට අනාගතයට අවශ්‍ය වන දේ පවා නිෂ්පාදනය කර හමාර බව අප දැන ගත යුතුය. එම නිෂ්පාදන මිලදී ගැනීමට අවශ්‍ය මනස පවා ඔවුන් විසින් සූදානම් කර ඇත.**

මේ නිසාම අප රටේ දක්ෂ දරුවන්ගේ නිර්මාණශීලි මනස වෙළෙඳපොළට ගැලපෙන ලෙස මෙහෙයවමින් හොඳ ව්‍යවසායකයින් බවට පත් කිරීම, ව්‍යවසායක සංස්කෘතියක් රටේ ඇති කිරීම සඳහා ව්‍යවසායකයින් උනන්දු කිරීම අත්‍යවශ්‍ය සාධකයකි.

අපේ තරුණ පරම්පරාවට බොහෝ නවීන අදහස් පහළ වුණත් එය ව්‍යාපාරික අවස්ථාවක් බවට පත් වීමට තිබෙනා ඉඩකඩ අල්ප වේ. ඒ සඳහා එම අදහස් වැඩි දියුණු කර ව්‍යපාර අවස්ථා බවට පරිවර්තනය කිරීම සඳහා විවිධාකාර වැඩසටහන් හා ආයතනවල මැදිහත්වීම අවශ්‍ය වේ.

**මෙය ආරම්භකල යුත්තේ පාසල් පද්ධතියෙන් හා නිවසෙනි. දරුවෙකු තුළ නිර්මාණශීලී අදහස් මතුවන විට එය අගය කරමින් වැඩි දියුණු කිරීම දෙමාපියන් හා ගුරුවරුන්ගේ වගකීමකි. එසේම එය වෙළෙඳ පොළ අගයක් ඇති දෙයක් බවට පත්කිරීම වැඩි දියුණු කිරීම කළ හැකි බව දරුවාට ඒත්තු ගැන්විය යුතුය.**

ඒ සඳහා විශ්වවිද්‍යාල ආයතන, වෘත්තීය පුහුණු කිරීම් ආයතන, රාජ්‍ය ආයතන, කාර්මික ආයතන ආදිය සූදානම් විය යුතු අතර කිසි දිනක විරැකියාවෙන් නොපෙළෙන දරුවෙකු අධ්‍යාපන ආයතනයෙන් පිටමං විය යුතුයි.

දැනටමත් විශ්වවිද්‍යාල පද්ධතියේද මේ සඳහා හොඳ නැඹුරුවක් පවතින අතර ඕනෑම අයෙකුට නව අදහස් පැන නැඟුන විට එය ව්‍යාපාර අදහසක් බවට පත් කර ගැනීමට විවිධ ආයතනවල සහාය පැතිය හැකියි.
මුල්‍ය සම්පාදනය අත්‍යවශ්‍ය නොවුණත් නව්‍ය අදහස් ව්‍යාපාරයක් බවට පත්වීමේදී සමහර විට මුල්‍ය සැපයීම සිදුවිය යුතුයි. දැනට රජයෙන් ක්‍රියාත්මක වන Enter Price Sri Lanka වැනි වැඩසටහන් පවතී. එසේම බැංකු ආයතනද මේ සඳහා සහාය වේ. විශේෂයෙන්ම උපාධි ධාරීන්ගේ විරැකියාව අඩු කරමින් ඔවුන් රටේ හොඳ ව්‍යවසායකයින් කිරීමේ මෙහෙවර ඇරඹී තිබීම සතුටට කරුණකි.

මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨය මගින් විද්‍යාවේදී ව්‍යවසායකත්වය පිළිබඳ විශේෂ උපාධිය ආරම්භ කර ඇති අතර ඕනෑම ඇල්මක් ඇති පාර්ශවයකට ව්‍යාපාරයක් ආරම්භ කොට මැනවින් පවත්වාගෙන යෑමට අවශ්‍ය දැනුම, කුසලතා ඔප් නැංවීම සඳහා සහතික පත්‍ර පාඨමාලාවේ සිට පශ්චාත් උපාධි දක්වා පාඨමාලා සකස් කොට ඇත.





# ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සේවා නියුක්තිය සහ අධ්‍යාපන මට්ටම

**එම්.බී. ඉරෝෂිකා බණ්ඩාර**
මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

**මානව ප්‍රාග්ධනය රටක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට අත්‍යවශ්‍ය සජීවි සාධකයකි. ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩ ලෝකයේ රැකියා අවස්ථා නොලැබීමත් උගත් තරුණ විරැකියාවත් ශ්‍රී ලංකාවේ පවතින බරපතල සමාජ ගැටලුවකි.**

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ සාර්ථකත්වයක් ලබා තිබුණද සාර්ථක සේවා නියුක්ති දායකත්වයක් දක්වා එය වර්ධනය කර ගැනීම අභියෝගයක් බවට වී ඇත. පසුගිය වර්ෂයේ ස්ත්‍රී ශ්‍රම බලකා දායකත්ව අනුපාතය පහළ වැටී ඇති අතර උගත් ස්ත්‍රීන් සහ පුරුෂයන්ගේ සේවා නියුක්ති තත්ත්වය තුළද පැහැදිලි පරතරයක් දක්නට ලැබෙයි.

## ප්‍රාථමික අධ්‍යාපන සහභාගීත්ව අනුපාතය

මෙය ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයේම එක හා සමාන තලයක පවතියි. ඉහළ අධ්‍යාපන සාධන මට්ටම තුළ ස්ත්‍රීන් පුරුෂයන් අභිබවා යාමට සමත්ව ඇත. උදා:2017 වර්ෂයේදී උසස් පෙළ විභාග යට පෙනී සිටි අපේක්ෂකයන්ගෙන් 58%ක් කාන්තාවන් වූ අතර විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබුවන්ගෙන් 67%ක පමණ ඉහළ ප්‍රතිශතයක් අත්කර ගැනීමට කාන්තාවන් සමත්ව ඇත.

## ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය

ප්‍රාථමික අධ්‍යාපනය තුළ දක්නට ලැබෙන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ද්වීතීක මට්ටමේදී පුරුෂයන් අභිබවා ගියද, කාන්තා ශ්‍රම බලකා දායකත්ව අනුපාතය 36.6% ක අඩු අගයක් ගනියි.මෙම අනුපාතය පසුගිය වසර දෙක තුළ ක්‍රමික අඩුවීමක් දක්වන අතර එය ලෝකයේ සහ ආසියාතික කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂවද අඩු මට්ටමකි.

2017 දී ශ්‍රී ලංකාවේ පුරුෂ ශ්‍රම සහභාගිත්ව අනුපාතය 74.5% කි. ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2016 දී 35.9 ක් වූ අතර පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්වය 75.1 ක් විය. ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයේ සුළු වර්ධනයක් පමණක් වීම නිසා සමස්ත ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 2017 වර්ෂයේදීද 54.1% ක ප්‍රතිශතයක් වෙයි (වගු අංක 01)

## සේවා වියුක්ති අනුපාතය

2016 වසරේ 7.0 ක්ව පැවති ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2017 වසරේදී 6.5% ක් දක්වා පහළ ගියේය. සමස්ත සේවා වියුක්ති අනුපාතිකය 4.4 සිට 4.2 දක්වා පහළ ගියද තරුණයන්, අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයින් සහ ස්ත්‍රීන්ගේ සේවා වියුක්තිය තවමත් ඉහළ මට්ටමක පවතියි.

2017 වර්ෂයේදී සමස්ත ඌන සේවා නියුක්ති ප්‍රතිශතය 2.8 ක් වන අතර පුරුෂ ඌන සේවා නියුක්තිය 2.2ක් වෙයි. ස්ත්‍රී ඌන සේවා නියුක්තිය 3.9 ක ප්‍රතිශත අගයක් ගනියි.

වගු අංක - 01 (ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය)

| | 2015 | | | 2016 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | සමස්ථ | ස්ත්‍රී | පුරුෂ | සමස්ථ | පුරුෂ | ස්ත්‍රී | සමස්ථ |
| ලෝකය | 76.1 | 49.5 | 62.9 | 76.1 | 49.57 | 62.8 | 75 | 49 | 62.0 |
| දකුණු ආසියාව | - | - | 54.5 | 76 | 29 | 54.4 | 79 | 28 | 55.0 |
| ශ්‍රී ලංකාව | 53.8 | 36.0 | 53.8 | 75.1 | 36.0 | 53.8 | 74.5 | 36.6 | 54.1 |

මූලාශ්‍රය : ගෝලීය සේවා නියුක්ති ප්‍රවණතා
(ජාත්‍යන්තර කම්කරු සංවිධානය) උදරකා Employment Social Outlook - Trends 2017 https$$data'worldbank'org$indicators/SLTF.CACT.MA.ZS

## අවිධිමත් අංශයේ සේවා නියුක්තිය

2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අවිධිමත් අංශයේ සේවා නියුක්තියේ සමස්තය 68.1 ක් වන අතර පුරුෂ සේවා නියුක්තිය 64.3ක් වෙයි. ස්ත්‍රී සේවා නියුක්තිය 35.7ක් වෙයි. මෙයින් පැහැදිලි වන්නේ, අවිධිමත් අංශයේද ස්ත්‍රී ශ්‍රම දායකත්වය පුරුෂ ශ්‍රම දායකත්වයට වඩා පහළ ප්‍රතිශතයක් ගන්නා බවයි.

ද්විතීයික රැකියා සහිතව ලංකාවේ සමස්ත රැකියා සංඛ්‍යාව 8,900,297 ක් වන අතර එය සංඛ්‍යාත්මකව පුරුෂ 5,785,377 ක්ද ස්ත්‍රී 3,114,920 වෙයි. රැකියා තත්ත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ද්විතීයික රැකියා ප්‍රතිශතය 2017 වර්ෂයේදී පහත පරිදි වෙයි. (වගු අංක 02)

වගු අංක - 02 (අවිධිමත් අංශයේ සේවා නියුක්තිය)

| සේවා තත්ත්වය | සමස්ත | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|
| සමස්තය | 692,118 | 73.1 | 26.9 |
| සේවකයන් | 115,110 | 79.5 | 20.5 |
| සේවා යෝජකයන් | 20,823 | 80.1 | 19.9 |
| ස්වයං ව්‍යාපාරිකයන් | 430,828 | 80.8 | 19.2 |
| දායකත්වය දක්වන පවුලේ ශ්‍රමිකයන් | 125,356 | 39.7 | 60.3 |

## ශ්‍රම වෙළඳපොල ඉල්ලුම සහ සැපයුම

ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය අඩුවීමට හා උගත් ස්ත්‍රීන්ගේ රැකියා වියුක්තිය ඉහළ මට්ටමක පැවතීමට බලපාන කරුණු රාශියකි. වගු අංක 03 විශ්ලේෂණයේ දත්ත අනුව ස්ත්‍රී පුරුෂ සේවා නියුක්තියේ විෂමතාවයක් දක්නට ලැබෙයි. පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය තුළ ස්ත්‍රීන්ගේ විශාල අඩුවක් පවතින අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් හා පුරුෂයන් ලබා ගන්නා නිපුණතාවන්හි බොහෝ වෙනස්කම් පැවතීම මීට බලපා අත. 2017 වර්ෂය තුළ රාජ්‍ය අංශයේ 528,489 රැකියා අවස්ථා ස්ත්‍රීන්ට ලබා දී ඇති අතර පෞද්ගලික අංශයේ ස්ත්‍රී සේවා නියුක්තිය 1,103,489 ක් විය. එසේම ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය සඳහා ඉහළම දායකත්වය පෞද්ගලික අංශය ලබාදෙයි. එනම් 40%ක් පෞද්ගලික අංශය සහ 15%ක් රාජ්‍ය අංශය ලෙසිනි. නමුත් කාන්තාවන්ට රැකියා අවස්ථා ලබා දීමේ දී පෞද්ගලික අංශය අඩු දායකත්වයක් ලබාදෙන අතර රාජ්‍ය අංශය තුළ කාන්තාවන්ට වැඩි රැකියා අවස්ථා උදා කර දී ඇත. මීට හේතු ලෙස පෙනී යන්නේ උසස් පෙළ කලා අංශයෙන් හැදෑරීමට ස්ත්‍රීන් වැඩි කැමැත්තක් දක්වන අතර විශ්වවිද්‍යාලයට ඇතුළත්වන පුද්ගලයින්ගෙන් 60% ක් කාන්තාවන් වීමත්, ඉන් කලා උපාධි සඳහා යොමු වන්නන්ගෙ න් 78%ක් කාන්තාවන් වීමත් ය. තවද කලා උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය 32.1% ක් පමණ වන බව නිරීක්ෂණය වී ඇත. කාන්තාවන් උසස් අධ්‍යාපනයේදී කලා විෂය ධාරාවට යොමු වීම නිසා උගත් ස්ත්‍රී සේවා වියුක්තිය ඉහළ යාමට හේතු වී ඇති බව පැහැදිලි වෙයි.

වගු අංක - 03 (ශ්‍රම වෙළඳ පොල ඉල්ලුම සහ සැපයුම )

| සේවා තත්ත්වයන් | සමස්තය | ස්ත්‍රී පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| සමස්තය | 100 | 100 | 100 |
| රාජ්‍ය සේවකයන් | 14.4 | 12.3 | 18 |
| පෞද්ගලික අංශ සේවකයන් | 43.3 | 46.4 | 37.7 |
| සේව්‍යයන් | 3 | 4.1 | 1.1 |
| ස්වයං ව්‍යාපාරිකයන් | 31.3 | 34.5 | 25.6 |
| ගෙවීමක් නොලද පවුලේ ශ්‍රමිකයන් | 8 | 2.6 | 17.7 |

මූලාශ්‍ර : KLIM 05/06 වන ප්‍රකාශනය - ජාත්‍යන්තර කම්කරු සංවිධානය ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - LFS (2017)

**ඉහළ අධ්‍යාපනයක් ලැබූ කාන්තාවන්ගේ රැකියා අවස්ථා වර්ධනය කිරීමට නම්**

- ශ්‍රී ලංකාවේ වර්තමාන සහ අනාගත ශ්‍රම වෙළඳපොළ තුළ නිපුණතාවයෙන් යුතු ශ්‍රමිකයන්ගේ හිඟයකට ලක් නොවීමට නම් කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය වැඩි කළ යුතුයි.

- ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය ඉහළ නැංවීම තුළින් නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රම සැපයුම වැඩිවීම මෙන්ම ස්ත්‍රී පුරුෂ විවිධත්වය තුළින් දක්නට ලැබෙන නව හැකියා සහ කුසලතා මඟින් ශ්‍රම බලකායේ ගුණාත්මක බවද වර්ධනය කිරීමට හැකියාව ලැබෙයි.

- දියුණුවෙමින් පවතින සහ දියුණු රටවල මෙන්ම අධ්‍යාපන අවස්ථා ලබා දෙන විට ශ්‍රම වෙළඳපොළට සරිලන විෂය පථයක් ආවරණය කළ යුතුයි.

- කාන්තාවන් සඳහා ප්‍රමාණවත් හිතකර රැකියා තත්ත්ව නිර්මාණය කළ යුත්තේ ජාතික මට්ටමේ ප්‍රතිපත්ති තුළිනි.

- කණ්ඩායමක් ලෙස වැඩ කිරීම, වාචික සන්නිවේදනය, ලිඛිත සන්නිවේදනය, කළමනාකරණ වගකීම්, සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම, විදේශීය භාෂාවන් පිළිබඳ දැනුම වැනි නිපුණතා සංවර්ධනය පාසල් අධ්‍යාපනය තුළින්ම සිදු කිරීම සහ ස්ත්‍රී අධ්‍යාපන මට්ටම සහ රැකියා වියුක්තිය අතර පරතරය නැති කළ යුතු අතර ආර්ථිකය සහ ස්ත්‍රීන් අධ්‍යාපනය සඳහා දරන ආයෝජනයේ ප්‍රතිලාභ ලබා ගැනීමට ස්ත්‍රීන්ට ආර්ථික කටයුතු සඳහා නියැලීමට ඇති බාධා ඉවත් කළ යුතුයි.

## යන්න ඒ ලොව වෙතට...

සිප් සතර දැන උගෙන
පාසලෙන් පියමංව
නව ලොවක් සොයන්නට
පිය නගන නැගණියේ

ජිවිතයේ මල් පිපෙන
ඔබ දකින සිහින වැල
නෙතු මාගේ දකින්නට
නොවෙද මේ හදිස්සිය

හදවතේ මනුගුණයි
දැතේ කළ හැකි බවයි
උගත්කම හා සිතයි
ඔබේ ශක්තිය එයයි

දමා අඩියක් පෙරට
සිතේ නොම සැක ඇතිව
යන්න ඒ ලොව වෙතට
ඇත නෑ අර අතන






# වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය
# University of Vocational Technology

***ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාල පද්ධතියට අලුතින්ම එක්වූ විශ්වවිද්‍යාලය වන්නේ වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයයි.***

අ.පො.ස උ/පෙ විෂය ධාරාවට එක් වූ තාක්ෂණ විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාලයට පිවිසීමට අපේක්ෂා කරන සිසුන්ගේ උපාධි සිහිනය සැබෑ කර ගැනීමටත්, අධ්‍යාපන ධාරාවෙන් පරිබාහිරව ජාතික නිපුණතා මට්ටම් ලබා ගනිමින් NVQ 5, 6 සුදුසුකම් ලබා ගත් අයගේ NVQ 7 එසේ නොමැති නම් උපාධි මට්ටම ලබාගැනීමට යා යුතු විශ්ව විද්‍යාලය වන්නේ වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයයි. මෙය 2008 අංක 31 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත රාජ්‍ය විශ්වවිද්‍යාලයකි. සම්ප්‍රදායික ගමන් මගෙන් වෙනස්ව ස්වකීය නිපුණතාවයන් හා හැකියාවන් මත පිහිටා උසස් අධ්‍යාපනය කරා ගමන් කිරීමට සිසුන් වෙත අවස්ථාව සැලසීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණයි. මෙය අයත් වනුයේ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයටයි.

**ඇතුලත් වීමේ සුදුසුකම්**

ජාතික වෘත්තීය සුදුසුකම හා ඒ හා සමාන ඩිප්ලෝමා සුදුසුකම් ලත් අයදුම් කරුවන් බඳවා ගැනීමෙන් අනතුරුව ඉතිරි පුරප්පාඩු සඳහා අයදුම් කර ඇති උසස් පෙළ සිසුන්ගේ ලකුණු පදනම් කරගෙන බඳවා ගනු ලබයි. එනම් උ/පෙ සමතුන් සඳහා Z අගයත් අනිකුත් අයදුම් කරුවන් සඳහා බුද්ධි පරීක්ෂණ ලකුණුත් අවශ්‍ය වන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් ද පවත්වනු ලැබේ. කෙසේ වෙතත් තාක්ෂණ විෂය ධාරාවේ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙයි.

මෙම විශ්වවිද්‍යාලය යටතේ විශ්ව විද්‍යාල විද්‍යායතන(university collages) 7ක් ඇත. එනම්

- රත්මලාන විශ්ව විද්‍යාල විද්‍යායතනය
- බටන්ගල (ඇඹිලිපිටිය විශ්ව විද්‍යාල විද්‍යායතනය)
- මාතර විශ්ව විද්‍යාල විද්‍යායතනය
- කුලියාපිටිය විශ්ව විද්‍යාල විද්‍යායතනය
- යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතන
- අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය
- කින්නියා විශ්වවිද්‍යාල විද්‍යායතනය

මෙම විශ්වවිද්‍යාල විද්‍යායතන හතෙන් බිහිවන NVQ 5, ඩිප්ලෝමා ලාභීන්ට හා NVQ 6 උසස්

ඩිප්ලෝමා ලාභීන්ටත් අධ්‍යයන සභාව පිළිගත් HNDT, ජර්මන්ටෙක්, වැනි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් ඩිප්ලෝමාධාරීන්ටත් මෙම විශ්ව විද්‍යාලයට අයදුම් කළ
හැකිය.

මෙහි අධ්‍යාපන පීඨ 2 කි.

- කර්මාන්ත හා වෘත්තීය තාක්‍ෂණ පීඨය
- පුහුණු තාක්‍ෂණ පීඨය

උපාධි පාඨමාලා පැවැත්වෙන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් වන අතර සතියේ දිනවල හා සති අන්තයේ උපාධි පාඨමාලා පැවැත් වේ. සතියේ දින පාඨමාලා නොමිලේ වන අතර සති අන්තය සඳහා වර්ෂයකට රු. 22000/- ක පමණ ගාස්තුවක් අය කෙරේ.


මෙම පාඨමාලා සඳහා එක් වර්ෂයකට දහසක් පමණ සිසුන් ඇතුළත් කර ගනු ලැබේ.

මීට අමතරව මෙම විශ්ව විද්‍යාලයෙන් වෘත්තීය අධ්‍යාපන ක්‍ෂේත්‍රයේ ගුරු පුහුණු කටයුතු හා කාර්ය මණ්ඩල පුහුණු කිරීම මෙන්ම අනෙකුත් අඛන්ඩ වෘත්තිකයන් සංවර්ධනය කිරීම ද සිදු වේ. ඉදිරියේදී මෙම වසර 3ක උපාධිය විශේෂවේදි උපාධියක් ලෙස වසර 4ක් දක්වා දීර්ඝ කිරීමටද නියමිතය. මෙම විශ්ව විද්‍යාලයද මහපොළ ශිෂ්‍යාධාර හා අනිකුත් පහසුකම් ශිෂ්‍යයන්ට ලබා දෙන අතරම රැකියා සොයා ගැනීමටද සිසුන්ට සහාය වේ. මෙම පුහුණුව නිපුණතා පාදක ක්‍රමයට සැකසී ඇති බැවින් රැකියාවක් සොයා ගැනීම සිසුන්ට පහසු ඉලක්කයක් වී ඇත.



**සටහන**
උමංගා චාන්දනී
ව්‍යාපෘති නිලධාරී
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

### NVQ ධාරාවේ උපාධිය දක්වා මග




**විශේෂ ස්තූතිය - පද්මශාන්ති ගමගේ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී
වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය

## වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය
## නො 100, කඳවල, රත්මලාන, ශ්‍රී ලංකාව.

| | |
|---|---|
| ශිෂ්‍ය සේවා කේන්ද්‍රය | +94 112 630 701 |
| අඛන්ඩ අධ්‍යයන කේන්ද්‍රය | +94 112 630 723 |
| කාර්යාලය | +94 112 630 700 |
| ෆැක්ස් | +94 112 630 705 |
| ඊ මේල් | univotec@univotec.ac.lk |